

# සරණ සිහි කරමු


පිටු අංක 47

උපතිස්ස කෝලිත කලණ මිතුරන්ගේ කථා වස්තුව
පිටු අංක 12

චූලසෙට්ඨි ජාතකය
පිටු අංක 31

සෙනෙහෙබර ආමන්ත්‍රණය
පිටු අංක 24

නිර්මාණ ඉසව්ව
පිටු අංක 55


ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව

උත්සාහයෙන් වීරයයෙන්... ජීවිතය ජයගන්නට වෙර දරනා...
පින්වන්ත දූ පුතුන් උදෙසා...


ශ්‍රී බුද්ධ වර්ෂ 2562 | ව්‍යවහාර වර්ෂ 2019
( ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් )


SCO
SHRADDHA CHARITY ORGANIZATION | www.sco.lk



මහා කාරුණික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සියලු දෙව් මිනිසුන් හට විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා!



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඥාණානන්ද ස්වාමීන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා
සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන
අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණමිත්‍ර
පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

මහමෙව්නාව භාවනා අසපුව

ශ්‍රද්ධා රූපවාහිනිය

ලක්විරු ගුවන්විදුලිය LAKVIRU RADIO

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද ගෞතම බුදු සසුන
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

නමෝ බුද්ධාය!

ශ්‍රී බුද්ධ වර්ෂ 2562ක් වූ අප්‍රේල් මස 10 වන දින දී ය.

පින්වත් දුවේ පුතේ,

ඔබ සෑම ආකාරයකින් ම දියුණුවට පත් වනවා දැකීම අප කාගේත් අපේක්ෂාවක්. ඔබේ හිතසුව කැමති, ඔබේ යහපත කැමති දෙමව්පිය, ගුරුවර, වැඩිහිටි පිරිස්, ඤාති හිතමිත්‍රාදීන් හැම කෙනෙකු ම ඔබේ ජයග්‍රහණවල දී බොහෝ සෙයින් සතුටට පත් වෙනවා. ඔබට ආශීර්වාද ද කරනවා. අද අප ඔබට සිහිපත් කර දෙන්න සිතුවේ ජීවිතයක සාර්ථකත්වය කෙරෙහි මේ ආශීර්වාදයන් කොතරම් බලපානවා ද කියන කාරණය යි.

දුවේ පුතේ, ඔබ ගුණවත් දරුවෙකු ලෙසින් යහපත් ඇවතුම් පැවතුම් ආදියෙන් යුතුව, ප්‍රියමනාප හැසිරීමෙන් යුතුව, කීකරු ව සිටිනවා දකින විට ඔබේ අම්මාගේත්, තාත්තාගේත් හදවතින් ම ආශීර්වාදයක් පැනනගිනවා. ඒ තමයි, 'මගේ දරුවාට යහපතක් ම යි වෙන්න ඕන' කියන හැඟීම. යම් දරුවෙකු තුළ පිහිටි ගුණයහපත්කම් නිසාවෙන් මේ ආකාරයෙන් ඒ දරුවා දෙමාපියන්ගේ ආශීර්වාදයට පත් වනවා නම්, ඒ දරුවා දියුණුවක් ම යි කැමති විය යුතු. සෙසු ලෝකය ම "දියුණු වන්නට නම් එපා" කියා දෙස්දෙවොල් තැබුවත් දෙමාපියන්ගේ හදවතේ ගැඹුරින් ම පැනනැගුණු ආශීර්වාදයේ හිමිකාරයෙකු වූ ඒ දරුවාට අසාර්ථක වීමක් නම් නෑ; දියුණුවක් ම යි සැලසෙන්නේ.

ඒ වගේ ම දුවේ පුතේ, ඇතැම් දරුවන්ගේ ගුණයහපත්කම් දැක සතුටට පත්වන ගුරුවර වැඩිහිටි හිතමිත්‍ර පිරිස් ද ඒ තමන්ගේ ම දරුවෙකු නොවූවත් හදවතින් ම පැනනැගුණු හිතවත්කමින් යුතුව

ඒ දරුවාට 'යහපතක් ම යි වෙන්න ඕන' කියා ආශීර්වාද කරනවා. මේ ආශීර්වාදය ද ජීවිතයේ සාර්ථකත්වයට ම යි හේතු වන්නේ.

මේ ලෝකයේ යහපත හමුවේ, ගුණධර්ම හමුවේ, ධර්මය හමුවේ සතුටුවන - එයට බොහෝ සෙයින් උපකාරක වන අදෘෂ්‍යමාන පිරිසක් ද සිටිනවා. ඒ තමයි දෙවිවරු. දුවේ පුතේ, සම්බුද්ධ ශාසනයක යම් පිනැතියෙක් ගුණයෙන් වැඩී යද්දී දෙවිවරු ද 'යහපතක් ම යි වෙන්න ඕන' කියා ආශීර්වාද කරනවා. ධාර්මික ආරක්ෂාව, රැකවරණය, උපකාරය සලසා දෙනවා. දෙවිවරුන්ගේ ආශීර්වාද ලබන කෙනා මේ ලෝකයේ අභිවෘද්ධියට පැමිණීමක් ම යි කැමති විය යුතු වන්නේ. බලන්න, මේ දේවාල ගාණේ ගොස් පුදපූජා පවත්වමින්, පඬුරු ගැට ගසමින්, භාරහාර වෙමින් ලබා ගත හැකි ආශීර්වාදයක් නොවෙයි. ඒ බව හොඳින් මතක තබා ගන්න.

ඒ වගේ ම දුවේ පුතේ, මේ ලෝකයේ සත්පුරුෂ ගුණයන් දරන - සත්පුරුෂ ගුණයන් තුළ වැඩී යන ශ්‍රමණ බ්‍රාහ්මණවරු සිටිනවා. මේ උතුම් සම්බුද්ධ ශාසනයක් විරාජමාන ව පවත්නා පින්වන්ත කාලයක් නිසාවෙන් අද අපට ඒ තැන දකින්නට ලැබෙන්නේ ලොවට අනුත්තර පින්කෙත වූ සංඝයා වහන්සේලා. ඒ උතුමන් යම් කෙනෙකුගේ සත්පුරුෂ ගුණ ශෝභාවන් දකිද්දී හදවතින් ම ආශීර්වාද කරනවා 'යහපතක් ම යි වෙන්න ඕන' කියලා. මේ ආකාරයෙන් සත්පුරුෂ උතුමන්ගේ ආශීර්වාදය ලබන කෙනා දියුණුවට ම යි පත් වන්නේ. කවදාවත් පිරිහීමක් නම් සිද්ධ වෙන්නේ නෑ.

මේ ආකාරයෙන් ආශීර්වාද ලද්දවුන් වූ විට අධ්‍යාපන කටයුතු ද දියුණු වනවා. මතක ශක්තිය වැඩෙනවා. කරන යහපත් කටයුතු සපල වෙනවා. පසුබැසීමක් සිදු නොවී, අතුරු ආන්තරාවන් අවම කොට ගත් මාර්ගයක ඔවුන් දියුණුවෙන් දියුණුවට ම පියනගනවා.

එය බලපෑමකින් ලබා ගන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ හදවතින් ම පැනනගින මහානුභාව සම්පන්න ආශිර්වාදයට හිමිකම ලැබෙන්නේ ගුණවන්ත වීම මතයි. එහෙම නම්, කළයුතු වන්නේ පෙනෙන නොපෙනෙන සත්පුරුෂ ලෝකයා විසින් හදවතින් ම ආශිර්වාද කරන ආකාරයේ ගුණවත් බවක් සහිත ජීවිතයක් උපදවා ගැනීම යි.

පින්වත් දුවේ පුතේ, ඔබත් ආශිර්වාද ලද්දවුන් වන්න. මේ එළඹෙන ශ්‍රී බුද්ධ වර්ෂ 2563 ඔබේ ජීවිතය සත්පුරුෂයන් විසින් සෑම කල්හි ම ප්‍රශංසා කරනු ලබන ජීවිතයක් බවට පත් කර ගන්න සිතේ අධිෂ්ඨානයක් ඇති කර ගන්න. පුංචි වරදෙත් බිය දකිමින්, අකුසල් බැහැර කරමින්, කුසලය ම යහපත ම දියුණු කරන සත්පුරුෂ දරුවෙක් ලෙසින් තවත් වැඩී යන්න. ගුණයක් තුළින් උපදවා ගන්නා මේ බලවත් බව ඔබේ ජීවිත සර්වප්‍රකාරයෙන් ම සාර්ථකත්වය කරා යොමු කරවනවා ම යි. එනිසා, අපි ඔබට හදවතින් ම ආශිර්වාද කරනවා, **"උතුම් සම්බුදු බලයෙන්, පසේබුදු ගුණ බලයෙන්, රහතුන්ගේ ද තේජසින්, සියලු රැකවරණ වේවා!"**

තෙරුවන් සරණයි!

ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,
පූජ්‍ය අලුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ
(ගරු අනුශාසක - ශ්‍රද්ධා මාධ්‍ය ජාලය)

# පටුන


01. කෝලිත උපතිස්ස කලණ මිතුරන්ගේ කථා වස්තුව 12

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 24

03. චූළසෙට්ඨි ජාතකය 31

04. සරණ සිහි කරමු 47

05. නිර්මාණ ඉසව්ව 55


06. මෝර පිරිත 67

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

(යමක වර්ගය)

**පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද**
**ස්වාමීන් වහන්සේ**



නැණවතා සැනෙකින් දහම දකී...

# උපතිස්ස කෝලිත කල්‍යාණ මිතුරන්ගේ කථා වස්තුව

**"නිසරු දෙයට රැවටුණොත් සරු දෙය අහිමි වෙයි.
නිසරු දෙය හා සරු දෙය වෙන් කොට දක්නා කෙනා පමණක් සරු දෙය හිමි කරගනියි."**

පින්වතුනේ, පින්වත් දරුවනේ, උපතිස්ස කෝලිත කියන්නේ කවුද කියලා ඇසුවොත් සමහර විට දැනටමත් ඔබ ඒ ගැන දන්නවා ඇති. මේ ගෞතම බුදු සසුනේ මහානුභාව සම්පන්න උතුම් ස්වාමීන් වහන්සේලා දෙනමක් වැඩසිටියා. ඒ තමයි සැරියුත් මහරහතන් වහන්සේත්, මුගලන් මහරහතන් වහන්සේත් යන රහතන් වහන්සේලා දෙනම. උපතිස්ස කිව්වේ සැරියුත් මහරහතන් වහන්සේගේ පැවිදි වෙන්න කලින් තිබුණු නමයි. මුගලන් මහ රහතන් වහන්සේගේ පැවිදි වීමට කලින් තිබූ නම තමයි කෝලිත කියලා කියන්නේ. සැරියුත් මහරහතන් වහන්සේ ප්‍රඥාවෙන් දෙවෙනි වන්නේ බුදුරජාණන් වහන්සේට පමණයි. වරක් කෙනෙක් ඇවිදින් බුදුරජාණන් වහන්සේ ගෙන් ඇසුවා ගෞතම බුද්ධ රාජ්‍යයේ සෙන්පතියා කවුද කියා. එවිට බුදුරජාණන් වහන්සේ විසින් මේ බුදුසසුනේ සෙන්පතියා වශයෙන් හඳුන්වන ලද්දේ සැරියුත් මහරහතන් වහන්සේවයි. මුගලන් මහරහතන් වහන්සේ ඍද්ධි බලයෙන් දෙවෙනි වන්නේ බුදුරජාණන් වහන්සේට පමණයි. ඒ උතුම් ස්වාමීන් වහන්සේලාගේ ජීවිත හරිම පුදුමයි. හරිම ආශ්චර්යයයි.

උපතිස්ස තරුණයා ඉතාමත් ලස්සනයි. රත්තරන් පාටින් ඔහුගේ ශරීරය දිළිසුණා. එතරම්ම ලස්සන කෙනෙක්. කෝලිත කියන තරුණයා කළු පැහැයෙන් සිටියත්, හරිම ලස්සන කෙනෙක්, ඕනම කෙනෙක් දුටු පමණින් වසඟ වෙනවා. මේ දෙදෙනාගේ යහළුකම වුනත් හරිම පුදුමයි. කවරදාකවත් එකිනෙකාට වෙනස්කමක් කරගෙන නැහැ. කුඩා අවධියේ ඉඳලාම දෙදෙනා එකටමයි හැදුනේ වැඩුනේ. දෙදෙනාම අඹ යහළුවෝ. ඒ කාලේ දඹදිව් තලයේ ඉතාම වැදගත් උසස්ම කුලවන්ත පවුල්වල තමයි ඒ දෙන්නාම උපන්නේ. උපතිස්ස

තරුණයාගේ උපන් ගම වුණේ රජගහ නුවර නාලක නම් වූ බමුණු ගමයි. කෝලිත තරුණයාත් රජගහ නුවරම උපන් කෙනෙක්.

දිනක් මේ යහළුවන් දෙදෙනා රජගහ නුවර කඳු මුදුනක තිබෙන උත්සවයක් බැලීමට ගියා. මේ උත්සවයට කිව්වේ 'ගිරග්ගසමජ්ජ' කියලයි. මේ උත්සවයේ තිබුනේ නැටුම් ගැයුම් වැයුම් ආදී නොයෙක් කෙළි සෙල්ලම් පමණයි. නොයෙක් රසමසවුළු වලින් පිරි ආහාර පානත්, නොයෙක් බීම වර්ගත් පිරී ඉතිරී තිබුනා. හැමෝම සතුටු වුණා. එකම විනෝද සාගරයක්. මේ අඹ යහළුවන් දෙදෙනාත් තම යහළු මිතුරන් සමඟ උත්සවය බලමින් සතුටු වුනා. කා බී විනෝද වුනා. එහෙත් වචනයෙන් කිව නොහැකි විශාල අඩුවක් ඔවුන්ට දැනෙන්න පටන් ගත්තා. මේ උත්සවවල විනෝද වෙවී කල් ගෙවන එකේ තේරුම කුමක්ද කියලා ඔවුන් කතාබස් කරන්න පටන් ගත්තා. ටිකෙන් ටික මේ උත්සවවලට තිබෙන ඇල්ම ඔවුන් තුළ නැතුව ගියා. "ඇත්තෙන්ම මේ ජීවිතයේ මහා ලොකු දෙයක් හැටියට තියෙන්නෙ කන බොන එකයි, සිංදු අහන එකයි, නටන එකයි විතරද? ජීවිතයේ මීට වඩා විශේෂ දෙයක් නැද්ද? අන්තිමේදී හීනයක් දැක්කා වගේ මේ හැම දෙයක්ම අවසන් වෙලා යනවා. ඒ නිසා අපි මේ වගේ බොරු දේවල් පස්සේ දුවන ගමනේ තේරුමක් නැහැ. අපි මේ ජීවිතය අවබෝධ කරගන්න පිළිවෙලක් සොයා ගෙන යමු. මොකක්ද මේ ජීවිතයේ ඇති හැබෑ තත්වය. අපට හැබෑවටම සැනසීමක් ඇතිව ජීවත් වෙන්න පිළිවෙලක් නැද්ද? ජීවිතයේ සත්‍ය තත්වය අවබෝධ කරගන්න ඇත්නම් කොයිතරම් අගේද?" කියලා කතාබස් කළා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, දඹදිව හැටි දන්නවා නෙ. එක එක ආගම් පිරුණු කෞතුකාගාරයක් වගෙයි. විවිධාකාර මතිමතාන්තර විශ්වාස පිළිගත්තු මිනිසුන් තමයි හැම තැනම ඉන්නේ. බුදුරජාණන් වහන්සේගේ කාලෙ පවා ඒ ආගමික පරිසරයේ වෙනසක් තිබුනේ නැහැ. එක එක්කෙනා තම තමන්ට හිතුමනාපේ හිතුනු හිතුනු දේවල් කිය කියා ආගමික නායකයන් වශයෙන් පෙනී සිටියා. ඒ දිනවලම රජගහ නුවර සංජය නම් වූ තාපසයෙක් හිටියා. ඔහු ඉතා ප්‍රසිද්ධයි. ඉතින් මේ උපතිස්ස කෝලිත නම් වූ සුන්දර තරුණයන් දෙදෙනාත්, ඒ සංජය පිරිවැජියාගේ ආශ්‍රමය කරා පසුවදාම පිටත් වුණා. තමන් ගේ

උදාර යහළුවන් දෙදෙනා ජීවිතාවබෝධය සොයමින් පිටත් වීම ගැන දෙසිය පනහක් පමණ වූ යහළුවන් පිරිසත් මහත් සතුටට පත් වුණා. උපතිස්ස කෝලිත දෙදෙනා සමඟම සංජයගේ ආශ්‍රමයට පැමිණියා.

සංජය කියන්නෙ එතරම් දක්ෂ කෙනෙක් නොවෙයි. නමුත් බෙහොම ප්‍රසිද්ධ කෙනෙක්. ඒ නිසා තමයි උපතිස්ස කෝලිත දෙදෙනාත් එතැන ඔහුගේ අතවැසි තවුසන් බවට පත්වුණේ. ඉතින් මේ උපතිස්ස කෝලිත දෙදෙනා සංජයගේ ධර්මය ඉක්මනින් ඉගෙන ගත්තා. ඉතා සුළු කලකින්ම ඒ ධර්මයෙන් ප්‍රයෝජනයක් නැතිවග මේ නුවණැති යොවුන් තවුසන් හට අවබෝධ වුණා. දිනක් දෙදෙනාම කථිකා කරගත්තා.

"පින්වත් කෝලිත, අපට මෙහෙ ඉඳලා එලක් නැහැ. මෙහෙ ජීවිතාබෝධය පිණිස කිසි දෙයක් නැහැ. හොඳම වැඩේ අපි නිදහසේ පිටත් වෙලා යන එකයි. අපි දෙන්නා දෙපැත්තකට යමු. කාටහරි ජීවිතාවබෝධය පිණිස වූ ධර්මය මුණ ගැසුණොත් නොවැරදීම අනිත් කෙනාටත් කිව යුතුයි."

මේ විදිහට කතිකා කරගත් දෙදෙනා මාවත් දෙකකින් පිටත්වෙලා ගියා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වුණේ චතුරාර්ය සත්‍යය ධර්මය ලෝකයට හෙළි කරදීම පිණිසමයි. ඒ බව උන්වහන්සේ වදාළ පළමු දේශනාව වන දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙන් හොඳින්ම ඔප්පු වෙනවා. ඒ දේශනාව වදාළේ බරණැස් නුවර සමීපයෙහි ඉසිපතන මිගදාය මේ සුන්දර වනයකයි. ඒ දෙසුම අහගෙන හිටියේ කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි යන ස්වාමීන් වහන්සේලායි. ඊට පස්සේ භික්ෂූන් වහන්සේලා පිරිස ඉතා ඉක්මනින් වැඩි වුනා. හොඳ බුද්ධිමත් තරුණ පිරිස් හරිම ආශාවෙන් පැවිදි වුනා. සිල් රැක්කා. භාවනා කළා. ධර්මය අවබෝධ කළා. සුන්දර සිත් ඇති රහතන් වහන්සේලා බවට පත් වුනා. උන්වහන්සේලා හරිම නිදහස් සිතින් මංමාවත් පුරා වැඩම කළා. නුවණැති මිනිසුන්ට මේ ධර්මය කියලා දුන්නා. හරිම වාසනාවන්ත යුගයක් බිහි වුණා.

ඉතින් පින්වතුනේ, පින්වත් දරුවනේ, ඒ දිනවල බුදුරජාණන් වහන්සේ වැඩසිටියෙත් රජගහ නුවරමයි. රජගහ නුවරට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ගෙන් දහම් ඇසීමේ වාසනාව බිම්බිසාර රජතුමාටත් උදාවුණා. ඔහු සෝවාන් වූ ගිහි ශ්‍රාවකයෙක් බවට පත් වුණා. රජතුමාට හරි සතුටුයි. ධර්මාවබෝධයෙන් ලැබුණු ප්‍රීතිය නිසා රජකම ලැබුණු දවසටත් වඩා සතුටු වුණා. බුදුරජාණන් වහන්සේ ආරාම පිළිගැනීමට අවසර දුන් බව දැනගෙන රජතුමා තවත් සතුටු වුණා. ඔහුට තිබුණා ලස්සන උද්‍යානයක්. හැමතැනම වවලා තිබුණේ සිහින් කොළ තිබෙන ලස්සන උණ පඳුරුයි. ලස්සනට මල් වවලා තිබුණා. හැම තැනම ලේනුන් පිරිලා සිටියා. ඒ උද්‍යානය නම් කරල තිබුණේ ලේනුන්ගේ අභයභූමිය කියලයි. රජතුමා එය වේළුවනාරාමය නමින් බුදුරජාණන් වහන්සේට පූජා කළා. ඒ පූජාව තමයි පළමුවෙන්ම ලැබුණු ප්‍රධාන ආරාමය වුනේ. 'වේළු' කියන්නේ උණ ගසටයි. උණගස් වලින් පිරුණු නිසා ඒ ලස්සන උද්‍යානය වේළුවනාරාමය නමින් හැඳින්වුනා. ඒ වගේම ගිජ්ඣකූට පර්වත මුදුනේත් නිස්කලංක පරිසරයක කුටි තනවා පූජා කළා. රහතන් වහන්සේලා පිඬුසිඟා වඩින ඉතා සුන්දර යුගයක් රජගහ නුවර බිහි වුනා.

එදා අස්සජි මහරහතන් වහන්සේ පිඬුසිඟා වඩින මාවතේ තරුණ උපතිස්ස තවුසාද ගමන් කරමින් සිටියා. ඒ රහතන් වහන්සේගේ සුන්දර ඉරියව් දුටු සැනින් තරුණ උපතිස්සයන් ඇසි පිය නොහෙළා බලා සිටියා.

'ම්... අමුතුම කෙනෙක්. අමුතුම සංවරයක්. ශාන්ත ගමනක්. නිවී ගිය පෙනුමක්. හරි පුදුමයි! මං බොහෝම තවුසන් දැක තිබෙනවා. පිරිවැජියන් දැක තියෙනවා. විවිධාකාර විමුක්ති ගවේෂකයන් දැක තිබෙනවා. නමුත් මේ ශ්‍රමණයන් වහන්සේ තුළින් ඒ කිසිවෙක් තුළ නොතිබූ වෙනසක් මට පේනවා. නිසැකවම මේ ශ්‍රමණයන් වහන්සේ සංසිඳී ගිය සිත් ඇති කෙනෙක්මයි....'

උපතිස්ස පිරිවැජියා අස්සජි මහරහතන් වහන්සේ පසුපසින් ගමන් කළා. උන්වහන්සේ ඉතා සංසුන් ලෙස පිඬුසිඟා වැඩීමෙන් ලබාගත් දානය රැගෙන වළඳන්නට තැනක් සොයා ගෙන පිටත් වුනා.

උපතිස්ස පිරිවැජියා උන්වහන්සේ පසුපසින්ම ගමන් කළා. උන්වහන්සේට පැන් පිළිගැන්වූවා. දන් වැළදීමෙන් පසුව අස්සජි මහරහතන් වහන්සේ සමඟ උපතිස්ස පිරිවැජියා කතාවට වැටුණා. අස්සජි මහරහතන් වහන්සේ දෙස ඇසි පිය නොහෙළා බලා සිටියා. ඉතා දීප්තිමත් නෙත් යුග තුළින් අසාමාන්‍ය කාන්තියක් විහිදුණා. ඒ මඳ සිනහවෙන් අහිංසක පිවිතුරු බවක් දිස් වුණා. උන්වහන්සේ කතා කරන හැම වචනයකම අවංකකමත්, සත්‍යයත් දිළිසෙන්න වුණා.

"පින්වත් උපතිස්ස, ඇත්තෙන්ම මේ පැවිදි ජීවිතයට මං අලුත් කෙනෙක්. මාගේ ශාස්තෘන් වහන්සේ තුළ ඇති ජීවිතාවබෝධය මහා සාගරය වගේ පළල් එකක්. අහස වගේ අනන්ත එකක්. හිරු එළිය වගේ දීප්තිමත් එකක්. එනිසා පින්වත් උපතිස්ස ඔබට විස්තර වශයෙන් කියන්න තරම් මා තුළ දැනුමක් නැහැ. ඒ නිසා මා සිතන්නේ වඩාත්ම හොඳ දෙය නම් ඒ මාගේ ශාස්තෘන් වහන්සේ මුණගැසෙන එකයි."

"පින්වත් ස්වාමීනී, ඒකෙ ඇත්තක් තියෙනවා. නමුත් ඔබවහන්සේ ගැන මගේ සිතේ ඇති වුණු පැහැදීම අනන්තයි. ඇත්තෙන්ම ස්වාමීනි, මගේ ජීවිතයේ ප්‍රථම වතාවටයි මෙතරම් සුන්දර චරිතයක් මුණ ගැසුණේ. ඔබ වහන්සේගේ හැම ඉරියව්වක්ම මාව වසඟයට පත් කළා. අනේ ස්වාමීනී, ඉතා ස්වල්පයක් වුණත් කමක් නැහැ. ඔබවහන්සේ දන්නා දෙය මට පවසා වදාළ මැනව. තේරුම් ගැනීම මා සතු දෙයක්. ඒ ගැන මට විශ්වාසයි."

අස්සජි මහරහතන් වහන්සේ උපතිස්ස තරුණයා දෙස බලා ඉතා අහිංසක ලෙස ගාථාවකින් උන්වහන්සේ තේරුම් ගත් ධර්මය මෙසේ පැවසුවා.

**යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතු තථාගතෝ ආහ**
**තේසඤ්ච යෝ නිරෝධෝ - ඒවං වාදී මහාසමණෝ**

හේතුන්ගෙන් උපදින - යම්තාක් දෙය ඇද්ද මෙලොවේ
ඒ හේතුන් පිළිබඳ - වදාහළ සේක තථාගතයාණෝ
යම් තැනක ඒ සියලු හේතුන් - සදහටම නැති වේ නම්
එබඳු දහමකි අපගේ - මහා සමණිඳු වදාරන්නේ

පින්වතුනේ, පින්වත් දරුවනේ, නුවණැති කෙනෙක් වෙනවා කියන එක වාසනාවක්මයි. මේ උපතිස්ස තරුණයාගේ නුවණ ගැන නම් පුදුමෙනුත් පුදුමයි. අපට මෙම ගාථාවෙහි අරුත කීවරක් කීවද තේරුමක් ගන්නට අමාරුයි. නමුත් මේ පුංචි ගාථාව තුළ අතිවිශාල තේරුමක් තියෙනවා. ඒ තේරුම ඒ විදිහටම තේරුම් ගැනීමට උපතිස්ස තවුසා හට මොහොතක්වත් ගත වුණේ නෑ. ඒ තරම්ම විස්මිත හැකියාවක් තිබුනා. ඒ ධර්මය අහපු ගමන් අවබෝධ වුණා. උපතිස්ස තරුණයා බුදුරජාණන් වහන්සේගේ සෝතාපන්න ශ්‍රාවකයෙක් බවට පත් වුණා. උපතිස්සට ඉතාමත්ම සතුටුයි. මුව නොසෑහෙන සේ අස්සජි මහරහතන් වහන්සේට ප්‍රශංසා කළා. උන්වහන්සේගේ පා යුග සිඹිමින් බිම දිගා වී වන්දනා කළා. මහා සතුටකට පත් වුණා. සෑහීමකට පත් වුණා. රටක් රාජ්‍යයක් ජයගත් කෙනෙක් පරිද්දෙන් විජයග්‍රාහී ලීලාවෙන් තම මිත්‍ර කෝලිතයන් සොයා පිටත් වුණා. දුරින්ම පැමිණෙන උපතිස්සයන්ගේ මුහුණෙහි දිස්වන සිනහවෙන් අලුත් යුගයක ආලෝකයක් දිස් වුණා. ඒ දෑස්වලින් උදාර සොයා ගැනීමක අනුහාවය පැතිරුණා. උපතිස්සයන් පැමිණෙන ආකාරය බලා සිටි කෝලිතයන් ඉදිරියට ගියා. හරි සතුටුයි. උපතිස්සයන් සිදු වූ සියල්ල කෝලිතට විස්තර කළා. අස්සජි මහරහතන් වහන්සේ වදාළ ගාථාව ඔහුටත් පැවසුවා. ඔහුගේ විස්මිත බුද්ධියේ කැඩපත තුළ බුදුරජුන්ගේ ධර්මය සදහටම පිහිටියා. ඔහුත් සෝතාපන්න ශ්‍රාවකයෙක් බවට පත් වුණා.

දෙදෙනාම කෙලින්ම ගියේ සංජය නම් වූ තම පැරණි ගුරුවරයා සොයාගෙනයි. ගුරුවරයා ළඟට ගිය දෙදෙනාම ඉතාමත් ආදරයෙන් ගුරුවරයාට කතා කළා.

“පින්වත් ආචාර්යතුමනි, ජීවිතාවබෝධය සොයා පැමිණි ගමනේදී අපි මෙතැනින් නැවතුණා. ඔබතුමා අපගේ ගුරුවරයෙක් ලෙස ඒ අවදියේ කටයුතු කළා. දැන් පින්වත් ආචාර්යතුමනි, ගුරු පඬුරු පුදකිරීමට අපට වෙලාව පැමිණුනා. අප මෙතෙක් කල් සොයමින් සිටි ජීවිතාවබෝධය අපට ලැබුණා. අප ඔබට දෙන ගුරු පඬුර නම් ඒ ජීවිතාවබෝධයයි. පින්වත් ආචාර්යතුමනි, අතිදුර්ලභ වූ ප්‍රඥාවකින් යුතු කිසිවකින් වසාලිය නොහැකි බුද්ධි මහිමයකින් යුතු අසාමාන්‍ය වූ ඍද්ධි බලයකින් යුතු, අද්විතීය වූ දේශනා විලාසයකින්

යුතු, සම්බුදුවරයාණන් වහන්සේ නමක් ලෝකයෙහි පහළ වී සිටිනවා. පින්වත් ආචාර්යතුමනි, දැන් අපගේ ආචාර්යවරයාණෝ උන්වහන්සේය. අපි ඔබට ගුරු පඬුරු ලෙස පිළිගන්වන්නේ උන්වහන්සේගේ ශ්‍රාවකභාවයයි. පින්වත් ආචාර්යතුමනි, එයට කැමැති වුව මැනැව."

ලාභසත්කාර වලින් වසඟ වූ සිත් ඇති අවාසනාවන්ත සංජය පිරිවැජියා ඒ දුර්ලභ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත්තේ නෑ. ඔහු මෝඩ පිළිතුරක් දුන්නා.

"ඔව්, ඥානවන්ත උදවිය ශ්‍රමණ ගෞතමයන් ළඟට ගියාපුවාවෙ. සියලු දෙනාටම නුවණ නැහැ නෙව. මෝඩයන්ටත් යන්න තැනක් ඕන. උන්දැල මගේ ළඟට ආපුවාවේ."

උපතිස්ස කෝලිත දෙදෙනාට ඔහු වෙනුවෙන් කළ හැකි දෙයක් නැහැ. ඒ දෙදෙනා වේළුවනාරාමය බලා පිටත් වුණා. දෙසිය පනහක් පමණ වූ පිරිස පිරිවරාගත් මේ අඹ යහළුවන් දෙදෙනා වේළුවනාරාමය බලා පිටත් වුණා. සියල්ල නැති වී ගිය කලෙක මෙන් කම්පනයට පත් සංජය පිරිවැජියා තැතිගත්තා. වෙව්ලන්න පටන්ගත්තා. තමා ළඟ සිටි පිරිස වෙන් වී නොපෙනී යනවාත් සමඟ කටින් උණු ලේ ගලන්න පටන් ගත්තා.

වේළුවනාරාමයෙහි දම්සභා මණ්ඩපයෙහි වැඩසිටි බුදුරජාණන් වහන්සේ දුරින් පැමිණෙන උපතිස්ස කෝලිත දෙදෙනා දෙස බලා පිරිස අමතා මෙසේ වදාළ සේක.

"පින්වත් මහණෙනි, අර රන්වන් සිරුරු ඇති පියකරු තරුණයා මේ සසුනෙහි අග්‍ර වූ ශ්‍රාවකයා වන්නේය. පින්වත් මහණෙනි, අර ඊළඟට පැමිණෙන කාලවර්ණ වූ සුන්දර තරුණයා මේ සසුනෙහි ඊළඟ අග්‍ර වූ ශ්‍රාවකයා වන්නේය. මේ දෙදෙනා මගේ අග්‍ර ශ්‍රාවකවරුය."

ඒ මොහොතේ උපතිස්ස කෝලිත දෙදෙනා ප්‍රමුඛ සියලු දෙනා බුදුරජාණන් වහන්සේ වෙත මහත් ගෞරවයෙන් වන්දනා කොට උතුම් පැවිද්ද ඉල්ලා සිටියා.

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, කාන්තාරයෙහි පැන් සොයා යන පිපාසිතයන් සේ නිවන සොයා ගිය අපට ඔබවහන්සේ සිහිල් දිය උල්පත වන සේක. අඳුරු ලොවක අතරමං වී ආලෝකය සොයා පීඩිතව ගිය අපට ඔබවහන්සේ ආලෝකය වන සේක. රෝගපීඩා වලින් ගොදුරුව පිහිටක් සොයා ගිය රෝගීන් වැනි වූ අපට ඔබවහන්සේ දහම් ඔසු ලබා දෙන වෙදැදුරාණෝ වන සේක. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, අපගේ ශාස්තෘන් වහන්සේ ඔබවහන්සේය. අපි වනාහී ශ්‍රාවකයෝ වෙමු. අපගේ හිරු මඬල ඔබවහන්සේය. අපි වනාහී තරු කැල වෙමු. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, අප කෙරෙහි අනුකම්පා උපදවා අපට පැවිදි උපසම්පදාව ලබාදෙන සේක්වා!"

උපතිස්ස කෝලිතයන් ප්‍රධාන සියල්ලෝම ඒහිභික්ෂු නම් වූ අති උත්තම වූ පැවිදිභාවයක් ලැබූහ. ඒහිභික්ෂු පැවිදිභාවය යනු ජීවමාන බුදු කෙනෙකුන් වෙතින් පමණක් ලබන පැවිදි බවයි. එය එක්තරා හාස්කමකින් සිදුවෙන දෙයකි. එනම්, බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරණ සේක.

"පින්වත් මහණෙනි, මෙහි එන්න. මා විසින් ඉතා පැහැදිලි ලෙස ධර්මය පවසා තිබෙනවා. මේ ධර්මයෙහි හැසිර හැම දුකින් නිදහස් වෙන්න."

මේ වදන් පවසනවාත් සමඟ ඒ සියලු දෙනාගේ කෙස් රැවුල් අතුරුදහන් වුණා. ගිහි වස්ත්‍ර අතුරුදහන් වුණා. කණකර ආභරණ අතුරුදහන් වුණා. මනාකොට සිවුරු හැඳ පොරොවාගත් භික්ෂූන් පිරිසක් බවට පත්වුණා. මේක මහා පුදුමයක්! කොහොමද මෙය වෙන්නෙ කියලා අපට නම් සිතාගන්නටවත් බැහැ. එතරම්ම පුදුම සහගතයි!

නමුත් පින්වතුනේ, පින්වත් දරුවනේ, බුදුරජාණන් වහන්සේ නමකගෙන් පමණක් ලබාගන්නා ඒ පැවිදිබව මෙවැනි යුගයක ජීවත් වන අපට තේරුම් ගන්න අමාරු වීම ස්වාභාවික දෙයක්. අනික ඔය වාසනාව පැවිදිවන සියලු දෙනාට ලැබෙන්නේ නැහැ. එයත් තමා සංසාරයේ කරන ලද පින්වලට අනුව ලැබෙන දෙයක්. ඉතින් සුළු

කලකදී උපතිස්ස තරුණයා සාරිපුත්ත මහරහතන් වහන්සේ බවට පත්වුණා. කෝලිත තරුණයා මුගලන් මහරහතන් වහන්සේ බවට පත්වුණා. සංජය පිරිවැජියාගේ පිරිහීම ගැන හැමතැනම පැතිරුණා. නිසරු දෙයක් සරු දෙයක් වශයෙන් කරගෙන ගිය පුහු වර්ණනාවේ නිෂ්ඵලකම ගැනත් හැමතැනම පැතිරුණා. මෙය මුල් කරගෙන බුදුරජාණන් වහන්සේ මෙම ගාථා දෙක වදාළ සේක.

**අසාරේ සාරමතිනෝ - සාරේ චාසාරදස්සිනෝ**
**තේ සාරං නාධිගච්ඡන්ති - මිච්ඡාසංකප්පගෝචරා**

ලොවේ නිසරු දේවල් ගැන - සිතනා විට සරු දේ ලෙස
සාරවත් දහම් මාවත - දකිනා විට නිසරු විලස
වැරදි අදහසට ගොදුරුව - ඇත්ත නොදකිනා ඔවුනට
සාර වූ ඒ අමා නිවන - නැත කිසිදා හමුවන්නේ

**සාරඤ්ච සාරතෝ ඤත්වා - අසාරඤ්ච අසාරතෝ**
**තේ සාරං අධිගච්ඡන්ති - සම්මාසංකප්පගෝචරා**

සරු දෙය සරු ලෙස දැනගෙන - නිසරු දෙයද හඳුනාගෙන
සාරවත් දහම් මාවත - දකිනා විට සරු ලෙසටම
නිවැරදි දැකුමෙන් යුතු වී - ඇත්ත දකින විට ඔවුනට
සාරවත් අමා නිවනම - හමු වෙනවාමයි නිසැකව

පින්වතුනේ, පින්වත් දරුවනේ, ඇතැම් කෙනෙකුට ආගමක් ඇදහිය යුත්තේ මක් නිසාද කියා තේරුමක් නැහැ. එතකොට ඒ උදවිය ලාභ බඩුවලට රැවටෙනවා වගේ ආගම්වලටත් රැවටෙනවා. එහෙම වෙන්නේ ආගමක් සෙවීමේ නියම තේරුම නොදන්නා නිසයි. සමහරු රැකියාවක් ලබාගැනීම පිණිස, විවාහයක් පිණිස, දරුවන් පාසලට දමා ගැනීම පිණිස, රෝගයක් සුවපත් කරගැනීම පිණිස, ගෙවල් දොරවල් සාදාගැනීම පිණිස, කෑම වේලක් පිරිමසා ගැනීම පිණිස ආගම වෙනස් කරනවා. නුවණ තියෙන අයට මේ උදවිය ගැන හරිම දුකයි. තාවකාලික ලාභ ප්‍රයෝජන පිණිස ආගම් අදහන අය කිසිසේත්ම නුවණ පාවිච්චි කරන්නේ නැහැ. තාවකාලික ප්‍රයෝජනය විතරයි සලකන්නේ. දුර බලන්නේ නැහැ. ඉතාමත් බොළඳ විදිහට

ළඟ විතරයි බලන්නේ. ඇත්තෙන්ම එවැනි කරුණක් උදෙසා අපි කිසිසේත්ම ආගමක් ඇදහිය යුතු නෑ.

පින්වතුනේ, පින්වත් දරුවනේ, තාවකාලික ලාභයක් පිණිස ආගමක් අදහන පුද්ගලයා ඇත්තෙන්ම අනුවණ මෝඩයෙක්මයි. ආත්ම වංචාවෙන් යුතුව තමා විසින් තමාව රවටා ගන්නා පුද්ගලයෙක්මයි. ඒ විදිහට තමන්ගේ තාවකාලික වාසිය විතරක් බලන පුද්ගලයා ඒ ආගමට හසු වෙන්නේ ඇමක් ගිලින මාළුවෙක් වගෙයි. ඊට පස්සේ ඇත්ත නැත්ත තෝරාගැනීමට ඔහුට බැරිව යනවා. සරු නිසරු දේ තෝරගන්නත් බැරිව යනවා. හොඳ නරකත් තෝරාගැනීමට බැරිව යනවා. එවිට වැටුණු වළෙන් ගොඩ එන්න බැරිව අන්තිමේදී ඒ නිසරු දෙයම වර්ණනා කරන්න පටන් ගන්නවා. පුහු මාන්නය නිසා ජීවිතාවබෝධය අහිමි වෙලා යනවා.

නමුත් පින්වතුනේ, පින්වත් දරුවනේ, ජීවිතයක අවබෝධ කළ යුතු පැති රාශියක් තියෙනවා. ඒ කියන්නේ අපි උපදින්නේ කොහොමද? උපන්නාට පසු අපි මුහුණ දෙන්නේ මොන වගේ රෝග පීඩාවලටද? මොන වගේ කරදර කම්කටොළුවලටද? අපට මේ අනතුරුවලින් මඟ හැර ඉන්නට බැරිද? අපි ආදරය කරන අය අපෙන් වෙන් වී යද්දී අපට එය වළක්වන්නට බැරිද? අප අකමැති දේවල් අපට ලැබෙද්දී එය වළක්වන්නට බැරිද? අප මේවාට මුහුණ දෙන්නේ කොයි ආකාරයෙන්ද? අපි කායිකවත්, මානසිකවත් ඉන්නේ ආරක්ෂා සහිතවද? ඔය වගේ දේවල් අපට ප්‍රශ්න හැටියට තියෙන බව ඇත්තෙන්ම අපි දන්නේ නැහැ.

බොහෝ දෙනෙක් හිතන්නේ නොපෙනෙන ලෝකයේ සිටින දෙව් දේවතාවුන් හට යාඥා කිරීමෙන් පුද පූජාවල් පැවැත්වීමෙන් ඔවැනි ප්‍රශ්නවලට විසඳුම් ලබා ගන්න පුළුවන් කියලයි. නමුත් අපට පැහැදිලිවම පේනවා ඒ ක්‍රමයෙන් විසඳුම් ලැබූ කෙනෙක් ලෝකයේ තවමත් බිහිවෙලා නැහැ. එහෙත් පැහැදිලිවම මේ සියලුම ප්‍රශ්න විසඳාගත් කෙනෙක්ව අපට මුණ ගැසෙනවා. ඒ තමයි ගෞතම බුදුරජාණන් වහන්සේ. සියලුම ප්‍රශ්න ඉදිරියේ උන්වහන්සේ සිනහ මුසු මුහුණින් වැඩසිටියා පමණක් නොවේ, අනෙක් අයටත් අටලෝ දහමින්

කම්පා නොවී සිටින ආකාරය මහා කරුණාවෙන් යුතුව කියා දුන්නා. සාරවත් දේ කියලා කියන්නේ එයටයි. ඒ සාරවත් දේ නම් චතුරාර්ය සත්‍යය ධර්මයයි.

පින්වතුනේ, පින්වත් දරුවනේ, අපට අඳුරත්,එළියත් වෙන් කොට හඳුනාගන්නා පුළුවන් වගේම, සරු දෙයත් නිසරු දෙයත් වෙන් කොට හඳුනා ගැනීමට පුළුවන් විය යුතුයි. එතකොට අපි නිසරු දෙය අත්හැරලා සරු දෙය කරා යන අය බවට පත්වෙනවා. චතුරාර්ය සත්‍යය අවබෝධය කරාම යනවා.



# සෙනෙහෙබර
# ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

දයාබර දරුවනි, ජීවිතය යහපත් කරගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සාහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*නමෝ බුද්ධාය!*

*ආදරණීය සඳුනිකා දුව වෙත,*

*දුව එවූ ලිපිය ලැබුණා. උසස් පෙළට ගණිත අංශයෙන් ඉගෙන ගන්න බව දැනගැනීම අපට ලොකු සතුටක්. ගණිත විෂයධාරාව අමාරු තමයි. ඒත් උත්සහයෙන්, කැපවීමෙන් ඉගෙන ගැනීමට හිත යොදවනවානම් ටික දිනකින් ම දුවට මේ විෂයන් අපහසුවක් නැතිවම අවබෝධ වේවි. දුවට උපකාරයක් වෙයි කියලා හිතලා අපි ඔයාට බොහොම ආදරයෙන් මේ පොත් ටික තෑගි කරනවා. ඉතින් දුව බොහොම උනන්දුවෙන් පාඩම් කරලා ගණිත අංශයේ උසස්ම ප්‍රතිඵල ලබා ගන්නට උත්සහ වෙන්න.*

*දුවගේ චිත්‍ර දැකලා අපි ගොඩාක් සතුටු වුණා. ඔයා මොන දේ කළත් විවේක වෙලාවට චිත්‍ර අඳින එක කවදාවත් අතපසු කරන්න එපා. අපි දෙන්නාට නම් ඒ වගේ ලස්සන චිත්‍ර අඳින්න බැහැ.*

*දුවට ලැබෙන දහම් පොත් බොහොම ගෞරවයෙන් පරිහරණය කරන්න. ඒවායේ තියෙන්නෙ දුර්ලභ උතුම් ශ්‍රී සද්ධර්මය යි.*

*දුව කවදාහරි අපි දෙදෙනාට ම වඩා උගත්, යහපත්, බුද්ධිමත් දියණියක් වෙනවා නම් අපි හරිම කැමතියි.*

*තෙරුවන් සරණයි.*

*මෙයට කැපකරු දෙමව්පියන්*

# ආදරණීය අම්මේ... තාත්තේ...

මේ ඔබෙන් ලද මහගු දායාදයට කෘතගුණ එක්වූ තවත් සෙනෙහෙවන්ත සටහන්...

*නමෝ බුද්ධාය!*

*පින්වත් දෙමව්පියනි,*

*ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය යටතේ මාගේ විශ්ව විද්‍යාල අධ්‍යාපන කටයුතු වෙනුවෙන් පින්වත් දෙමව්පියනි, ඔබ මා හට ලබා දුන් මෙම උපකාරයට මා මුලින්ම කෘතඥතා පූර්වකව පුණ්‍යානුමෝදනා කරමි. පින්වත් දෙමව්පියනි, ඔබ ලබාදෙන මෙම මුදල මා හට බොහෝ සේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ම උපකාර වන බව සතුටු සිතින් සිහිපත් කරමි. මා තව තවත් ඉතාමත් උනන්දුවෙන් ම මාගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට ඔබගේ මෙම උපකාරයෙන් බලාපොරොත්තු වෙමි. තවද මා පින්වත් දෙමව්පියන් මෙන් ම භාග්‍යවතුන් වහන්සේම සරණ යමි. ශ්‍රී ධර්ම රත්නයේ ම සරණ යමි. උතුම් ආර්ය මහා සංඝරත්නයේ ම සරණ යමින් උතුම් සත්පුරුෂයන්ම ඇසුරු කරමින් ගුණ දහමින් යුතුව කටයුතු කරන බවද ඔබට පුණ්‍යානුමෝදනා පූර්වකව මෙත් සිතින් පින් අනුමෝදනා කරමින් සිහිපත් කිරීමට කැමැත්තෙමි.*

*පින්වත් දෙමව්පියනි, ඔබ ලබාදුන් මුදලින් මා කැලණිය රජ මහා විහාරය වැඳ පුදා ගැනීමට ගිය අවස්ථාවේ දී පදික වේදිකාවේ සිටි අසරණ අම්මා කෙනෙකුට කෑම එකක් හා වතුර බෝතලයක් පරිත්‍යාග කරමින් පින් රැස්කර ගත්තා. තවද මම කැලණිය මහා සෑ රජුන්ට නිල් මානෙල් මල් පූජා කර වන්දනා කරමින් පින් රැස් කර ගත්තා. තවද උතුම් කැලණිය බෝ සමිඳුන් වැඩ සිටින බෝ මළුවට වැලි ඇතිරීමට ද දායක වීමෙන් ද, බෝ සමිඳුන්ට පැන් පූජා කරමින් ද බොහෝ කල් හිත සුව පිණිස උතුම් කුසල් රැස්කර ගත්තා.*

*මා විසින් ඒ රැස්කර ගත් සියලු පින් පින්වත් දෙමව්පියනි, ඔබටත් එසේම එකසේ අනුමෝදන් කරමි අනුමෝදන් වෙත්වා! පින්වත් ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු මහ සඟ රුවනටත්, විශේෂයෙන්ම පින්වත් සුබෝධි ස්වාමීන් වහන්සේටත්, පින්වත් අනගාරිකා මෑණිවරුන්ටත්, පැවිදි අපේක්ෂක පින්වත් පිරිසටත්, පින්වත් ශ්‍රද්ධා සමාජ සත්කාර අංශයේ සියලු දෙනාටත්, මා විසින් රැස් කරගත්තා වූ සියලු පින් කුසල් එකසේ අනුමෝදන් කරමි අනුමෝදන් වෙත්වා! පින්වත් දෙමව්පියනි, ඔබ ඇතුළු සියලු දෙනා මේ ගෞතම බුදු සසුනේ දී ම උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරත්වා! ඔබ සියලු දෙනාට උතුම් වූ දහම් ඇසම පහළ වේවා!*

*තෙරුවන් සරණයි!*

*මෙයට කැපකරු පුතණුවන්*

නමෝ බුද්ධාය!

දයාබර කැපකරු අම්මේ, තාත්තේ,

මාස 03කට පමණ කාලෙකට පසුව ඔබව ආමන්ත්‍රණය කරන්නට වීම ගැන හිතේ පොඩි කණගාටුවක් තියෙනවා. ඒත් මම මේ ලිපිය ලියන්නෙ නම් ලොකු සතුටකින්. 2018 වසරේ මම මගේ ජීවිතේ ලොකු කඩයිමකට මුහුණ දුන්නා. ඒ තමයි අ.පො.ස (සා/පෙළ) විභාගය. මම පුරා වසර ගණනාවක් තිස්සේ ගත් උත්සාහයේ ප්‍රතිඵලය මට මාර්තු 28 වෙනිදා ලැබුණා. මම A සාමාර්ථ 9ක් අරගෙන ඉතා විශිෂ්ට ලෙස විභාගය සමත් වුණා. අපේ පාසලේ මීට කලින් කවදාවත් A-9ක් අරගෙන නෑ. ඒ නිසා රාජකීය ඉතිහාසය රන් අකුරින් ලියන්නට මට පුළුවන් වුණා. මට ඒ තැනට යන්න පාර පෙන්නපු, වචනෙකින් හරි උදව් කරපු අයට මම ගොඩක් ස්තූතිවන්ත වෙනවා.

එදා රෑ Result ආපු වෙලාවෙ මම කෑ ගහලා ඇඬුවා. එදා මගේ ඇස්වලින් වැටුණු සතුටු කඳුළුවල මගේ අම්මා තාත්තා වගේම ඔයාලත් අයිතිකාරයො. ඒ මොකද කිව්වොත් දහඩිය, කඳුලු හෙලා මට උගන්වන්න වෙහෙසෙන මගේ දෙමාපියන්ගෙ බරෙන් කොටසක් ඔයාලගෙ කරගෙන, ඔයාලා උපයන මුදලින් මගේ අධ්‍යාපන කටයුතු කරගන්න ඔයාලා උදව් කළ නිසා. ඉතිං මෙච්චර දවසක් මා හට උපකාර කළාට ඔයාලට ගොඩක් පින්. ඊලගට මම මුහුණ දෙන්නේ ජීවිතයේ තීරණාත්මක කඩයිමට. ඉතිං එයත් ජයගන්න මට ඔයාලා ශක්තියක් වේවි කියලා මම හිතනවා. මේ කරන උපකාරය දිගටම මම බලාපොරොත්තු වෙනවා.

ඔයාලාට මේ කාර්යය සිදු කිරීමට, මාව ඔයාලාට හඳුන්වා දීපු ශ්‍රද්ධා මාධ්‍යජාලයේ පින්වත් ලොකු ස්වාමීන් වහන්සේටත්, ශ්‍රද්ධා මාධ්‍යජාලයේ සියලුම නැන්දලා මාමලාවත් මම ඉතා ස්තුති පූර්වක සිතින් සිහිපත් කරනවා.

තෙරුවන් සරණයි.

මීට කැපකරු දියණිය

## නමෝ බුද්ධාය!

ආදරණීය කැපකරු දෙමව්පියන් වෙත ස්තූති පුදකර ලියමි.

ආදරණීය අම්මේ, තාත්තේ, ඔබලා සුවෙන් සිටිනවා ද? ඔබලා සුවෙන් පසුවෙතැයි මම සිතමි. මමනම් සුවෙන් පසුවෙමි. ඉමක් කොනක් නොපෙනෙන මේ මහා සංසාරය තුළ උතුම් වූ මිනිසත් බව ලබන්නට තරම් ඔබත් මාත් බෙහෙවින් ම පින් කොට තිබේ. මින් පෙර කවර ආත්ම භවයක දී මා ඔබගේ සෙවණෙහි ඔබගේ ම පුතෙකු වී, ඔබගේ සෙනෙහස ලබමින් කල් ගෙවන්නට ඇතැයි විටෙක මට සිතේ. ඔබ මා කාගේ කවුරුන්දැයි වත් හරිහැටි නොදැන මෙලෙසින් යළි හමුවන්නේ ඒ සාංසාරික බැඳීම නිසා විය හැකිය. මෙලෙසින් ඔබ කරන මේ මහා උපකාරයට මා මහත් ණයගැති වෙමි.

ඉතින් අම්මේ, තාත්තේ, මෙලෙසින් ඔබගේ මේ මහත් උපකාරය ලබමින් මගේ ජීවන අරමුණු සපල කරගන්නට, මාගේ අහිංසක දෙමව්පියන්ගේ බලාපොරොත්තු ඉටු කරගන්නට ඔබත් මමත් මෙලෙසින් හමුවන්නේ ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන නිසාවෙනි. එම නිසාම මගේ ගෞරව පූර්වක ස්තූතිය හා පුණ්‍යානුමෝදනාව ගෞරවණීය ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහනට පුද කර සිටින්නේ ඉමහත් ගෞරවයෙනි.

අම්මේ, තාත්තේ, ඔබලා දහදිය වගුරුවා මහන්සියෙන් ඉපැයූ මුදලින් විශාල මුදල් ප්‍රමාණයක් මා වෙනුවෙන් මෙලෙසින් කැපකරනා බැවිනි. අම්මේ, තාත්තේ, මම ඔබට පොරොන්දු වෙමි. ඔබගේ මේ පරිත්‍යාගයෙන් උපරිම ප්‍රයෝජන ලබමින් ඔබගේ විශ්වාසයත්, දෙමව්පියන්ගේ අහිංසක බලාපොරොත්තුවත් සැමදා බවට මම ඔබට පොරොන්දු වෙමි. මම මහන්සි වී අධ්‍යාපන කටයුතුවල නිරත වී සාමාන්‍ය පෙළ විභාග යෙන් විශිෂ්ඨ ප්‍රතිඵල ලබා ගැනීමට සෑම විටම වෙර දරමි.

දිනපතා ම බුදුන් නැමැද ත්‍රිවිධරත්නයේ පිහිට ලබන්නට කුඩා කල සිටම මාගේ දෙමව්පියන් මා හට හුරුකර තිබේ. බුදුන් වදින සෑම අවස්ථාවක දී ම මම ඔබලා

*සිහිපත් කොට ප්‍රාර්ථනා කරන්නේ නිදුක් ව, සැපවත් ව සිටීමට හැකි වේවා! යන ප්‍රාර්ථනාව යි.*

*ආදරණීය අම්මේ, තාත්තේ, මම මෙතනින් නවතිමි. ඔබලාට නිදුක් නීරෝගී සුවය හා වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට ශක්තිය, ධෛර්යය ලැබේවා! ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු සියලුම ස්වාමීන් වහන්සේලාට නිදුක් නීරෝගී සුව උදා වේවා!*

*සියලුම ස්වාමීන් වහන්සේලා මෙන්ම, දෙමව්පියනි, ඔබට ද තෙරුවන් සරණයි!*

*මෙයට කැපකරු පුතණුවන්*



# චූලසෙට්ඨි ජාතකය

චූලසෙට්ඨිතුමා උපදෙස් දුන් කථාව

පින්වතුනේ, පින්වත් දරුවනේ,

චූලපන්ථක මහරහතන් වහන්සේ ගැන ඔබ කලින් අසා ඇති. එක් ගාථාවක් පාඩම් කරගන්න බැරිව ගොඩාක් අපහසුතාවන්ට පත්වුනේ උන්වහන්සේ තමා. අපේ භාග්‍යවතුන් වහන්සේ ඒ චූලපන්ථකයන්ට පිහිට වුනා. ඒ නිසා අගතනතුරු ලාභී මහා රහතන් වහන්සේ නමක් වුනා. උන්වහන්සේ ගේ ජීවිතය ගැන කියැවෙන ලස්සන කථාවයි අපි දැන් ඉගෙන ගන්නේ.

රජගහ නුවර ධනවත් සිටුපවුලක ලස්සන සිටු දුවක් හිටියා. ඈ ගොඩාක් හිතුවක්කාරයි. ඈත් පටාචාරා වගේ යොවුන් කාලේ සමනල ජීවිතයක් ගත කළේ. ඒ සිටුමැදුරේ සේවය කළ දාසයෙක් සමග ප්‍රේම සම්බන්ධයක් හදාගත්තා. සෑහෙන කාලයකට ජීවත් වෙන්න පුළුවන් විදිහට වටිනා බඩුත් අරගෙන අර දාසයත් සමග සිටුමැදුරෙන් පැනල ගියා. ඈත පළාතකට ගොහින් පැල් කොටයක් හදාගෙන ජීවත් වුනා.

කලක් ගත වෙද්දි සිටු කුමාරිට දරු ගැබක් හටගත්තා. එතකොට ඈ ගොඩාක් අසරණ වුනා. තනි වුනා. ආයෙමත් රජගහ නුවර සිටුමැදුරට යමු කියල සිය සැමියාට යෝජනා කළා. ඔහු හොඳට ම භය වුනා. බැරි වෙලාවත් සිටුතුමා තමාව අල්ලා ගත්තොත් මරා දමාවි කියල කිව්වා. ඈ අහන්නෙම නෑ. ඈ දැන් ගෙදර යන්න ඕන කියලා රණ්ඩු කරනවා. සැමියා ඒකට කොහෙත්ම කැමති නෑ.

දවසක් සැමියා කුලී වැඩට ගිය වෙලාවේ ඈ ගෙදරින් පැනලා ගියා. සැමියා ගෙදර එද්දී ඈ ගෙදර නෑ. අසල්වාසීන්ගෙන් තොරතුරු දැනගෙන සැමියා ඈ ගිය පාරේ එක පිම්මේ දිව්වා. ඈ මහ පාරේ ගහක් යටට වෙලා කෙඳිරි ගගා ඉන්නවා. සැමියා ඈ සොයාගෙන ආවා. ඈට අමාරුයි. මහපාරේම දරුවා ලැබුනා.

"දැන් මහගෙදර යන්ට වුවමනාව නෑ නොවැ. බබා ලැබුනානේ. අපි හෙමිහිට ආපසු ගෙදර යමු" කියල සැමියා ඈවත් බබාවත් රැගෙන ගෙදර ගියා. මහපාරේ සිඟිත්තා ලැබුණු නිසා ඔහුට පන්ථක යන නම ලැබුනා. පන්ථ කියන්නේ පාරට යි.

කලක් යද්දි තවත් දරුවෙක් ලැබෙන ලකුණු පහළ වුනා. කලින්

වගේම ඈට සිටුගෙදරට යන්ට ඕනා කියල සැමියාට ඇවිටිලි කළා. ඒ වතාවෙත් සැමියාගෙන් අවසර නොලැබුන නිසා සැමියා නැති වේලේ පොඩි පුතාවත් අරගෙන මහගෙදර යන්න පිටත් වුනා. ඒ වතාවෙත් සැමියා ඈව සොයාගෙන ආවා. අතරමග මහපාරේ දෙවෙනි පුතාත් හම්බ වුනා. මහගෙදර ගමන වැළකුනා. ආපහු ගෙදර ආවා. ඉතින් ඔවුන් තමන්ගේ ලොකු පුතාට මහාපන්ථක කියන නම දැම්මා. පොඩි පුතාට චූලපන්ථක කියල නම දැම්මා. දැන් මේ දරු දෙන්නා සුවසේ වැඩෙනවා. අහල පහල ළමයි සෙල්ලම් කරද්දී ඒ ළමයි තම තමන්ගේ මාමල, බාප්පලා, ආච්චිලා, සීයලා ගැන කථා කරනවා. මේ ළමයින්ට එහෙම නෑදෑයෝ කවුරුත් නෑ. ඉතින් මේ දරු දෙන්නා ගෙන් තමන් ගෙ නෑදෑයන් ගැන අසද්දී කියන්ට දෙයක් නැති වුනා. දවසක් දරු දෙන්නා අම්මා ගෙන් මෙහෙම ඇහැව්වා.

"අම්මේ...... ඇයි අම්මේ අපට නෑදෑයෝ නැත්තේ..... අනිත් ළමයි හැමෝට ම නෑදෑයෝ ඉන්නවා. එයාලා බලන්න නෑදෑයෝ එනවා. එයාලා නෑදෑ ගෙවල්වල යනවා..... අනේ..... අම්මේ..... අපට කාත් කවුරුවත් නැද්ද.....?"

"ඉන්නවා පුතේ..... ඔයාලට මහා ධන සම්පත් තියෙන, ගොඩාක් දේපල වස්තුව තියෙන නෑදෑයෝ ඉන්නවා."

"අම්මා බොරු කියනවා..... එහෙමනම් අපි මොකටද මේ පැල්පතේ ඉන්නේ..... අම්ම ගේ ඔය නෑදෑයෝ කොහේද ඉන්නේ?"

"පුතේ..... රජගහ නුවර ධන සිටුතුමා ඔයාගේ සීයා. ඒ සිටුදේවි ඔයාගේ ආච්චි..... නමුත් පුතේ අපට දැන් එහෙ යාගන්ට විදිහක් නෑ නොවැ."

"අනේ.... ඇයි අම්මේ..... අපට එහෙම වුනේ."

"මෙහෙමනේ මයෙ පුතේ..... ඔයාලගේ තාත්තාගෙයි මගෙයි කසාදෙට අපේ දෙමව්පියෝ කැමති නෑ. ඒ නිසා අපි එයාලගෙ අකමැත්තෙන්, එයාල විරුද්ධ වෙද්දි තමයි මේ වගේ ඈත පළාතකට ආවේ...... දැන් අපට එහෙ යන්ට බැහැ පුතේ."

එතකොට ඒ දරුවන් ආයෙ ආයෙම රජගහනුවර යමු කියල

අම්මාට බල කරන්න පටන් ගත්තා. නෑදෑයන් බලන්න ඕනාම කියලා කිව්වා. දරුවන් ගේ ඇවිට්ලිල්ලෙන් බේරෙන්න බැරි තැන අම්මාත් සිටු ගෙදර යන අදහස සැමියාට කිව්වා.

"අනේ හිමියනි.... අපි නිකමට යමු. මෙච්චර ලස්සන පුතාල දෙන්නෙක් දැක්කට පස්සේ.... මොකෝ එයාල අපේ මස් කාවිද...?"

"හප්පේ.... මට නම් යන්ට බැහැ. ඔයා කියනවා නම් මං තුන්දෙනාව ම ගිහින් ඇරලවන්නම්."

"ඒත් කමක් නැහැ අනේ.... මේ දරුවන්ටත් අනාගතේ කලදසාවක් තියෙන්ට එපායැ."

ඉතින් ඔවුන් පුතුන් දෙන්නත් රැගෙන අනුපිළිවෙළින් රජගහනුවරට ආවා. එක් නවාතැන් පොළක නැවතුනා. පුතුන් ගේ අම්මා දරුවනුත් රැගෙන සිටුගෙදරට ගියා. තමන් මව්පියන් දකින්න ආ බවත්, පුතුන් දෙදෙනෙකුත් ඉන්නා බවත් දැනුම් දුන්නා.

පණිවිඩය ගෙන ගිය සේවකයා ටික වේලාවකින් පැමිණියා.

"නැගණියනි..... සිටුතුමා මෙහෙම කිව්වා. සසර සැරිසරා යද්දි මුණ ගැසෙන දූලාගෙත් පුතාලාගෙත් කෙළවරක් නෑ. එහෙම එකේ අපට ඉතා බලවත් වරදක් කළ ඔබලා ඇසින් දකින්න කැමති නෑ කිව්වා. මේන්න මේ ධනය දුන්නා..... ගිහින් සුවසේ ජීවත් වෙන්න කිව්වා..... දරු දෙදෙනාව සිටු මැදුර ඇතුළට කැඳවාගෙන එන්න කිව්වා. දරු දෙන්නාව ඇති දැඩි කරන්නම් කිව්වා."

එතකොට සිටු කුමරිය තම පියා එවූ ධනය ගත්තා. දරු දෙදෙනා සිටුමැදුරට පිටත් කළා. කඳුළු වැකුණු නෙතින් සිටුමැදුර දෙස බලා ඉඳලා ආපසු පිටත් වෙලා ගියා.

දැන් මේ දරු දෙදෙනා සිටුමැදුරේ සුවසේ වැඩෙනවා. චූලපන්ථක තවම සිඟිති යි. මහාපන්ථක සීයා සමග නිතර බණ අසන්ට වේළුවනාරාමයට යනවා. එහිදී ශාස්තෘන් වහන්සේව ඇසුරු කරන්ටත් ලැබෙනවා. මනෝභාවනීය භික්ෂූන් ඇසුරු කරන්ටත්

ලැබෙනවා. දවසක් මහාපන්ථක පුතු සීයාගෙන් මෙහෙම ඇහුවා.

"සීයේ.... මේ සංසාර ගමන හරීම භයානක දෙයක් නේද සීයේ..... සම්බුදු කෙනෙක් මුණ ගැසුන මෙවැනි අවස්ථාවක් නම් අපට ලැබෙන්නෙ නෑ නේද සීයේ...."

"ඒක ඇත්ත පුතේ..... බුදු සසුනක් මුණ ගැසීම කියන්නේ අතිදුර්ලභ දෙයක් නොවැ..... පුතා සිතන විදිහ බොහොම හොඳා....."

"ඉතින් සීයේ..... සීයා මට අවසර දෙනවා නම් මාත් උතුම් බුදු සසුනේ පැවිදි වෙන්නද සීයේ."

එතකොට සීයා සාධුකාර දුන්නා. "සාදු... සාදු... මයෙ පුතේ.... මේ කාලෙ පැවිදි වෙනවා කියන්නේ මොනතරම් උතුම් දෙයක් ද....! පැවිදි වෙයන් මයෙ පුතේ...! මේ බිහිසුනු සසරෙන් එතෙර වෙන්ට බලාපන්..."

මහාපන්ථකට සීයාගේ අවසර ලැබුනා. සීයා මේ දරුවා රැගෙන භාග්‍යවතුන් වහන්සේ බැහැදකින්ට ගියා.

"මහා සිටුවරය..... මේ පුතා කවුද...?"

"ස්වාමීනී.... මේ මගේ ලොකු මුණුපුරා..... භාග්‍යවතුන් වහන්සේ ළඟ පැවිදි වෙන්න ඕනා කියනවා. ඒකයි මං මේ එක්කරගෙන ආවේ..... මං නොවැ මේ දරුවාගේ භාරකාරයා..... මං කැමතියි ස්වාමීනී..... පැවිදි වෙන එක මොනතරම් දෙයක් ද....!"

එතකොට භාග්‍යවතුන් වහන්සේ සංඝයා ලවා මහාපන්ථකයන් පැවිදි කරවා වදාළා. ඒ මහාපන්ථකයන් ඉතා උත්සාහයෙන් ධර්මය ඉගෙන ගත්තා. විසි වයස් පිරුන විට උපසම්පදා වුනා. ටික කලකින් රහතන් වහන්සේ නමක් බවට පත්වුනා. දිනක් මහාපන්ථක භික්ෂුව මෙහෙම හිතුවා.

"උතුම් බුදු සසුනක පැවිදි වෙන්ට ලැබුන නිසා මට මේ සසර

දුකින් එතෙර වෙන්ට වාසනාව උදාවුනා. අනේ..... අපේ මල්ලීටත් මේ උතුම් නිර්වාණ සුඛය දෙන්නට ඇත්නම් කොතරම් අගේ ද....” කියලා. ඉතින් මහාපන්ථක භික්ෂුව තම සිටු සීයා ළඟට ගිහින් මෙය පැවසුවා.

“සිටුතුමනි.... මං මේ කල්පනා කළේ අපේ මල්ලීවත් පැවිදි කරගන්නයි. ඔබ කැමැති නම් මං චූලපන්ථක එක්කරගෙන ගිහින් පැවිදි කරවන්ට ද.....?”

“අනේ.... හොඳා ස්වාමීනී...... මගේ මුනුබුරන් දෙන්නෙක් ම බුදු සසුනේ මහණදම් පුරනවා දකින්න ලැබීම මොනතරම් වාසනාවක් ද?”

චූලපන්ථකත් පැවිදි වුනා. තම සහෝදර ස්වාමීන් වහන්සේ යටතේ දැන් ධර්මය ඉගෙන ගන්නවා. හැබැයි එක බණ පදයක් මතක හිටින්නෙ නෑ. ඒ තරම් දුර්වලයි. දවසක් මහාපන්ථක තෙරුන් පොඩි නමට මෙන්න මේ ගාථාව කියල දුන්නා. කටපාඩම් කරගන්න කිව්වා.

**“පදුමං යථා කෝකනදං සුගන්ධං**
**පාතෝ සියා ඵුල්ලමවීත ගන්ධං**
**අංගීරසං පස්ස විරෝචමානං**
**තපන්තමාදිච්චමිවන්තලික්ඛේ”ති.**

**උදයෙ පිපී සුවඳ හමන රතු පියුමක් වැන්නේ**
**සරත් කලට අහසෙ දිලෙන හිරු මඬලක් වැන්නේ**
**සිල් සමාධි ගුණ නුවණින් හැම විට බබළන්නේ**
**අන්න බලන් අංගීරස සම්දුය වැඩ ඉන්නේ**

අනේ... මාස හතරක් ම පොඩිනම මහන්සි වෙනවා.... උඩ පදය මතක තියාගෙන දෙවැනි පදය කියද්දි ආයෙමත් අමතක වෙනවා. කොහෙත්ම බැහැ. කටපාඩම් හිටින්නෙ ම නෑ.

පින්වතුනේ, පින්වත් දරුවනේ,

කර්ම විපාක කියන්නේ අපට සිතින් සිතා අවසන් කරන්ට බැරි දෙයක්. කාශ්‍යප සම්මා සම්බුදුරජුන් ගේ කාලේ චූලපන්ථක ඒ කාශ්‍යප බුදු සසුනේ පැවිදි වෙලා හිටියා. ඒ කාලේ හරිම ප්‍රඥාවන්තයි.

මොහොතකින් පාඩම් හිටිනවා. ඒ කාලේ කටපාඩම් හිටින්නෙ නැති භික්ෂුවකට මේ භික්ෂුව විහිලු කළා. ගැරහුවා. එතකොට අර භික්ෂුව ලැජ්ජාවට පත්වුනා. කටපාඩම් කිරීම නැවැත්තුවා. බලන්න කර්මය පස්සෙන් එන හැටි. මේ ආත්මේ තමන්ට කටපාඩම් හිටින්නෙ නෑ. තම සහෝදර මහාපන්ථක තෙරුන් ටිකක් සැරට කතා කළා.

"චූලපන්ථක..... දැන් හාරමාසයක් ගෙවුනා. කෝ..... මේ.... එක...ම ගාථාව පාඩම් කරගන්න බැහැ..... මේ වගේ සුළු දෙයක් කරගන්න බැරි ඔබ මහණකමේ ප්‍රතිඵල කොහොම ලබන්ට ද....? මෙහෙ සිටීමෙන් ඵලක් නෑ...... යනවා යන්න."

එතකොට චූලපන්ථක පොඩිනම මහාපන්ථක තෙරුන්ට වන්දනා කළා. හඬ හඬා කුටියට ගියා. ඒ දවස්වල දානය සඳහා සංඝයාට දැනුම් දෙන්නේ මහාපන්ථක තෙරුන් විසිනුයි. ජීවක කෝමාරභච්චයන් ගේ නිවසේ දානයක් යෙදිලා තිබුනා. ඒ පන්සියයක් භික්ෂූන් උදෙසා. දානය මතක් කරන්ට ආ ජීවකයන් හට මහාපන්ථක තෙරුන් මෙහෙම කිව්වා.

"උපාසක, අපේ චූලපන්ථක හැර අනෙක් භික්ෂූන් සියලු දෙනාම හෙට දානයට වඩීවි. චුල්ලපන්ථකගෙන් වැඩක් නැහැ..... බුදු සසුනේ දියුණුවක් ලබාගන්නට බැරි කෙනෙක් නොවැ..... ඒ නිසා ඔහු ඇර අනික් හැමෝම වඩීවි."

චූලපන්ථක පොඩිනමට මේ කතාව ඇහුනා. මහත් කම්පාවට පත්වුනා. "අනේ..... අපේ සහෝදර ස්වාමීන් වහන්සේ ගේ සිත බිඳිලා. අයියෝ.... මං දැන් මොකද කරන්නේ.... මං හරිම ආසයි දිගටම පැවිදි ජීවිතේ ඉන්න. අනේ.... ඒත්.... මං දැන් කොහොමද මෙහෙ ඉන්නේ..... අනික මං කොහොමද ආයෙමත් ගෙදර යන්නේ...."

චූලපන්ථක පොඩිනම එදා රෑ පුරා හඬ හඬා හිටියා. පසුවදා පාන්දර ගෙදර යන්න කියල යන්න ගියාට යාගන්න බෑ. විහාරයේ දොරටුව ළඟ වාඩි වුනා. ආයෙමත් හඬන්න පටන් ගත්තා. ටික වේලාවකින් කවුදෝ කෙනෙක් ඇවිත් ආදරයෙන් හිස අතාගානවා තේරුනා. චුල්ලපන්ථක පොඩිනම හිස ඔසොවා බැලුවා. "අනේ...

අපගේ භාග්‍යවතුන් වහන්සේ වැඩලා" චුල්ලපන්ථක වහා නැගිට භාග්‍යවතුන් වහන්සේට වන්දනා කළා.

"ඇයි...... චුල්ලපන්ථක.... මොකද මේ හඬ හඬා.... මොකද වුනේ.....?"

"අනේ.... ස්වාමීනී.... අපේ මහාපන්ථකයන් වහන්සේ මට ගෙදර යන්ට කිව්වා. මට හාරමාසයක් ම ගාථාවක් පාඩම් කරගන්ට බැරිවුනා."

එතකොට මහාකාරුණික භාග්‍යවතුන් වහන්සේ චුල්ලපන්ථකගේ අතින් අල්ලාගෙන ආදරයෙන් කතා කළා.

"එහෙම කොහොමද කරන්නේ.... චූලපන්ථක පැවිදි වුනේ මං උදෙසා නේ. ඉතිං කෙලින්ම ඇවිදින් මට කියන්ට තිබුනා නොවැ..... හා!.... දැන් ඉතින් කමක් නෑ. ගෙදර යන්ට ඕන නෑ. අපි දැන් විහාරෙට යමු.... චූලපන්ථක භය වෙන්ට කාරි නෑ...... මං කියන විදිහට කටයුතු කරන්ට. ඒ අඩුපාඩු හැමදෙයක් ම සම්පූර්ණ වෙලා යාවි."

ඉතින් භාග්‍යවතුන් වහන්සේ චූලපන්ථක ගේ අතින් අල්ලා ගෙන සුගන්ධ කුටිය ඉදිරියට වැඩියා. ඉර අව්ව හොඳින් වැටෙන තැනක වාඩි කෙරෙව්වා.

"හා... දැන් මේ අළුත් සුදු රෙදිකඩ ගන්න. 'කිළිටි අත්හැරීම... කිළිටි අත්හැරීම...' කියල හොඳින් සිහි කරමින් අනිත් අතින් පිරිමදිමින් ඉන්න."

භික්ෂු සංඝයාට දානය පිණිස කල් දැනුම් දුන්නා. භාග්‍යවතුන් වහන්සේ සංඝයා පිරිවරාගෙන ජීවක ගේ නිවසට වැඩියා. පනවන ලද ආසනවල වැඩ සිටියා.

චූලපන්ථක පොඩිනම තවම රෙදි කඩ පිරිමදිමින් ඉන්නවා. ඉර අව්වට දාඩිය දැම්මා. අර අලුත් සුදු රෙදි කඩ ටිකෙන් ටික කිළිටි වෙන්න පටන් ගත්තා. චූලපන්ථක සසරේ පුරුදු කළ විදර්ශනා ප්‍රඥාව මතුවෙන්න පටන් ගත්තා.

"හැබෑට ම.... භාග්‍යවතුන් වහන්සේ මගේ අතට දුන්නේ

මොනතරම් අලුත් සුදු රෙදිකඩක් ද... නමුත් මේ කුණු සරීරයේ තැවරීම නිසා කිළිටි වෙලා යනවා නොවැ.... හටගත්තු හැම දෙයක් ම හරි වේගයෙන් වෙනස් වෙනවා නොවැ."

එතකොට ම චූලපන්ථකට භාග්‍යවතුන් වහන්සේ ගේ මිහිරි ස්වරය ඇහෙන්න පටන් ගත්තා.

"චූලපන්ථක...... දැන් ඔබට අතේ තිබුන සුදු රෙදි කඩ කිළිටි වෙලා යන හැටි පෙනෙනවා..... ඔය කිලුට බලවත් කිලුටක් නොවේ. ඔබේ සිත තුළ තිබෙන රාගය තමයි බලවත්ම කිලුට. අන්න ඒ රාග කිලුටයි අත්හරින්ට ඕනා. එය බැහැර කරන්ට ඕනා" කියල භාග්‍යවතුන් වහන්සේ මියුරු සරින් මේ ගාථා තුන වදාළා.

**රාග කෙලෙස් ම ය ලොව සැබෑ කිලුට**
**අනිකුත් කිලුටු නම් නොවේ**
**රාගයට ම යි කිලුට කියන්නේ**
**මැනැවින් දුරු කොට මේ රාග කිලුට**
**රාග කිලිටි නොමැති සසුනෙහි**
**ඒ භික්ෂූහු වසත් ම ය සුවසේ**
**ද්වේෂ කෙලෙස් ම ය ලොව සැබෑ කිලුට**
**අනිකුත් කිලුටු නම් නොවේ**
**ද්වේෂයට ම යි කිලුට කියන්නේ**
**මැනැවින් දුරු කොට මේ ද්වේෂ කිලුට**
**ද්වේෂ කිලිටි නොමැති සසුනෙහි**
**ඒ භික්ෂූහු වසත් ම ය සුවසේ**

**මෝහ කෙලෙස් ම ය ලොව සැබෑ කිලුට**
**අනිකුත් කිලුටු නම් නොවේ**
**මෝහයට ම යි කිලුට කියන්නේ**
**මැනැවින් දුරු කොට මේ මෝහ කිලුට**
**මෝහ කිලිටි නොමැති සසුනෙහි**
**ඒ භික්ෂූහු වසත් ම ය සුවසේ**

මේ ගාථාවන් වදාරා අවසන් වෙනවාත් සමඟම චූලපන්ථක

පොඩිනම පටිසම්භිදාලාභී මහරහතන් වහන්සේ නමක් බවට පත්වුනා. පටිසම්භිදා ඥාණ ලබන කොට භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්මය මැනවින් ධාරණයෙහි පිහිටා අමතක වීමේ දෝෂය සම්පූර්ණයෙන් ම නැති වුනා.

ඒ චූලපන්ථක භික්ෂුව පෙර ආත්මයක රජෙක් වෙලා හිටියා. දවසක් මේ රජු නගරය ප්‍රදක්ෂිණා කරද්දි අව් රස්නෙට නළලින් දහඩිය වැගිරුනා. එතකොට ඔහු තමන් ගේ පිරිසිදු සුදු සළුවෙන් නළල පිසදැම්මා. මුහුණ පිසදැම්මා. සැණෙකින් සළුව කිළුටු වුනා. 'මේ සරීරයේ අපවිත්‍ර බව නිසා නේද මේ සළුව කිලිටි වුනේ. හටගත් හැම දෙයක් ම අනිත්‍ය වෙලා යනවා නේද කියලා එදා ඒ රජුට සිතුනා. භාග්‍යවතුන් වහන්සේ චූලපන්ථකයන් එදා රජෙකුව සිටියදී මෙනෙහි කළ අනිත්‍ය සඤ්ඤාවට උපකාරී වීම පිණිසයි මේ අයුරින් සුදු රෙදි කඩ දුන්නේ.

ජීවක කෝමාරභච්චයන් අපේ භාග්‍යවතුන් වහන්සේට දන් පිළිගැන්වීම පිණිස පැන් බඳුන අරගෙන ඇවිත් පාත්‍රයට පැන් දමන්න සූදානම් වුනා. එතකොට භාග්‍යවතුන් වහන්සේ අතින් පාත්‍රය වසා මෙහෙම වදාළා.

"ජීවක... විහාරේ භික්ෂුවක් ඉන්නවා."

මහාපන්ථකයන් වහන්සේ මෙහෙම කිව්වා. "නෑ ස්වාමීනී.... විහාරේ භික්ෂූන් නැහැ. හැමෝම වැඩියා නොවැ."

"ජීවකය, විහාරේ භික්ෂුවක් ඉන්නවා" කියලා ආයෙමත් වදාළා. එතකොට ජීවකයන් සේවකයෙකුව ඇමතුවා.

"අනේ කොලුවෝ.... හනික ගොහින් බලාගෙන වරෙන් විහාරේ භික්ෂූන් ඉන්නවා ද නැද්ද කියලා."

ඒ සේවකයා විහාරයට දුවගෙන ගියා. මුළු ජීවක අඹවන විහාරය පුරාම භික්ෂූන් ඉන්නවා. ඇතැම් භික්ෂූන් අමදිනවා. ඇතැම් භික්ෂූන් සිවුරු මසනවා. ඇතැම් භික්ෂූන් සිවුරු පඬු පොවනවා. ඇතැම් භික්ෂූන් සක්මන් කරනවා. තව භික්ෂූන් භාවනා කරනවා.

සේවකයා කලබල වුනා. ආපහු දුවගෙන ගියා. ජීවක ළඟට

ගිහින් මෙහෙම කිව්වා. "අනේ...... පින්වත් හිමියනි, හරි වැඩේ නොවැ..... අඹවනයේ දහස් ගණන් භික්ෂූන් ඉන්නවා කියලයි මට හිතෙන්නේ. ගණනකට ගන්ට බැරි තරම්."

එතකොට භාග්‍යවතුන් වහන්සේ මෙහෙම වදාළා.

"පුරුෂය.... ආයෙමත් ඔබ යන්න. ගිහින් 'චූලපන්ථක භික්ෂුව ශාස්තෘන් වහන්සේ කැඳවන සේක' කියල කියන්න.

එතකොට ඒ පුරුෂයා ආයෙමත් දුවගෙන ගියා. "ස්වාමීනී.... චූලපන්ථක කියන්නේ කවුද....?" කියලා ඇහැව්වා.

'මම යි චූලපන්ථක' කියල එක් භික්ෂුවක් කියද්දි හැමෝම ඒක කිව්වා. කොලුවා ආයෙමත් කලබල වුනා. හරි වැඩක් නොවැ වුනේ කියල ආයෙමත් ජීවකගේ නිවසට දුවගෙන ගියා. භාග්‍යවතුන් වහන්සේට කරුණ සැළකළා.

"අනේ... ස්වාමීනී.... ඒක මහා පුදුම දෙයක්.... මං ඇහැව්වා චුල්ලපන්ථක කියන්නේ කවුද කියලා.... මේන්න එතකොට හැමෝම කිව්වා නොවැ මම යි චූලපන්ථක කියන්නේ කියල.... හප්පේ මං කොහොමෙයි උන්වහන්සේව සොයා ගන්නේ....?"

"පුරුෂය.... ඔබ ආයෙමත් යන්න. ගිහින් ආයෙමත් ඒකම අහන්න. මුලින් ම කතා කරන භික්ෂුව ගේ අතින් අල්ලන්න. එතකොට අනිත් භික්ෂූන් නොපෙනී යාවි."

කොලුවා ආයෙමත් දුවගෙන ගියා. ආයෙමත් ඇහැව්වා. එතකොට ළඟම හිටිය භික්ෂුව මම යි චූලපන්ථක කියන කොටම අතින් අල්ලා ගත්තා. අනිත් සියලු භික්ෂූන් නොපෙනී ගියා.

"අනේ.... ස්වාමීනී.... ඉක්මනින් වඩිමු. භාග්‍යවතුන් වහන්සේ කතා කරනවා" "හොඳයි පින්වත... ඔබ යන්න.... මං එන්නම්" කියල චූලපන්ථක භික්ෂුව ඉර්ධියෙන් වැඩියා. එදා දානයෙන් පස්සෙ භුක්තානුමෝදනාව පිණිස චූලපන්ථක භික්ෂුවට පැවරුනා. හරි පුදුමයි.... එක් ගාථාවක් පාඩම් නොසිටිය භික්ෂුව ගඟුලැල්ලකින් ගලා හැලෙන සුනිල දිය දහරක් සෙයින් මිහිරි සරින් ධර්මය කිව්වා.

එදා සවස් වරුවේ රැස් වූ භික්ෂූන් මේ අසිරිමත් සිද්ධිය ගැන කතා කරමින් හිටියා.

"ඇවැත්නි.... තමන් ගේ ම සහෝදර මහාපන්ථකයන්ට චූලපන්ථක තේරුම් ගන්ට බැරිවුනා නොවැ. හාර මාසයක් ම ගාථාවක් පාඩම් කොරගන්ට බැරිව හිටියා කියල විහාරයෙන් බැහැර කළා නොවැ.... හප්පේ.... බලන්ට.... අපේ භාග්‍යවතුන් වහන්සේ හරීම ලස්සනට ඒ සියලු දොස් නැති කරලා පිහිට වූ හැටි.... සම්බුදු බලය නම් මහා පුදුම සහගතයි."

එතකොට භාග්‍යවතුන් වහන්සේ එතැනට වැඩියා. ඒ භික්ෂූන් තමන් කතා කරමින් සිටි කාරණාව භාග්‍යවතුන් වහන්සේට සැළකළා. ඒ වෙලාවේ භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළා.

"මහණෙනි, ඔය චූලපන්ථක මේ ආත්මයේ මං නිසා ධර්මය තුළ මහත් ආනුභාවයට පත් වුනා. මනෝමය ශරීරයන් මවා පාන්ට අතිශයින් ම දක්ෂ වුනා. මහත් ධර්ම බලයට පත්වුනා. කලිනුත් ඔහොම වුනා. එක් ආත්මයක මොහු මගේ උපදේශයක් පිළිපැදීම නිසා මහා ධන කුවේරයෙක් වුනා."

ඉතින් එතැන සිටිය භික්ෂූන් වහන්සේලාට චූලපන්ථක භික්ෂුව අතීත ආත්මයක අප බෝසතාණන් ගේ උපදෙස් පිළිපැද මහා ධනවතෙක් වීම ගැන දැනගන්ට ආසා හිතුනා. ඒ කථාව කියාදෙන්න කියලා භාග්‍යවතුන් වහන්සේට ආයාචනා කළා. භාග්‍යවතුන් වහන්සේ ඒ අවස්ථාවේ මේ චූලසෙට්ඨි ජාතකය වදාළා.

"මහණෙනි, ඒක වුනේ මෙහෙමයි. ඉස්සර ඈත අතීතයේ කසී රට බරණැස් පුරේ බ්‍රහ්මදත්ත නමින් රජ කෙනෙක් වාසය කළා. ඔය කාලේ බෝධිසත්වයෝ බරණැස ම සිටු පවුලක උපන්නා. වියපත් වෙද්දි ඔහුටත් සිටු තනතුරු ලැබුනා. 'චූලසෙට්ඨි' කියන නමින් ප්‍රසිද්ධ වුනා. ඒ කාලේ මොහු ඉතා නුවණැති කෙනෙක්. දවසක් චූලසෙට්ඨි තුමා රාජකාරිය සඳහා රාජමාළිගයට යමින් සිටියා. පාර අයිනේ තිබුන මී කුණක් දැක්කා. දැකලා මෙහෙම කිව්වා.

"මේං.... බලාපල්ල.... මී කුණක් තියෙනවා. නුවණ තියෙන කෙනෙකුට අලුතෙන් රස්සාවක් පටන් ගන්ට මේකත් ඇති.... හොඳින් මොළේ ඇතිව වැඩ කළොත් මේකෙන් ම දියුණුවට පාර කපා ගන්ට පුළුවනි" කියල පිටත් වෙලා ගියා.

ඒ කතාව අහගෙන සිටිය පිරිස අතරේ ඉතා දුගී දුප්පත් කොලුවෙක් හිටියා. ඔහු මෙහෙම හිතුවා. "මේ චූලසෙට්ඨිතුමා මහා නුවණැත්තෙක් හැටියටයි රට්ටු පිළිගන්නේ. මේ කතාව බොරුවක් වෙන්ට බැහැ.... මං කෝකටත් මේ මී කුණ අරගන්ට ඕනා." මෙහෙම සිතලා අර කොලුවා මී කුණ අරගෙන පාරේ යද්දී එක් නිවසක බළල් පැටියෙක් කෑ ගසනවා. මොහු එතැනට ගිහින් අර බළලාට මී කුණ දෙන්න කියල ඒ නිවැසියන්ට කිව්වා. ඔවුන් සතුටු වෙලා ඒ වෙනුවෙන් ඉතා සුළු මුදලක් දුන්නා. මොහු ඒ මුදලින් උක්පැණි මුලකුයි පොඩි හැලියකුයි ගත්තා. වනයට ගිහින් මල් නෙලාගෙන එන මාලාකාරයන්ට උක් පැණි ටික ටික දුන්නා. හැලියෙන් පැනුත් දුන්නා. එයින් ඔවුන් ගේ වෙහෙස සංසිඳුනා. ඔවුන් සතුටට පත්වුනා. ඒ සතුට නිසා ඒ හැමෝම මල් මිට ගානේ දුන්නා. ඔහු එදාම ඒ මල් මිටි විකුණා ගත්තා. පසුවදාත් උක් පැණියි දිය හැළියකුයි අරගෙන මල් වත්තට ම ගියා. එදා සතුටු වූ මල් වෙළෙන්දා බාගෙට නෙළාගත් මල් අත්ත ගානේ මොහුට දුන්නා.

ටික දවසයි ගියේ. දැන් මොහු ගේ අතේ කහවණු අටක් තියෙනවා. පසුවදා සුළඟක් ඇවිත් රජ උයනේ ගස් වලින් වියළි දර අතු ගොඩාක් බිම කඩා වැටුනා. ඔහු උයන්පල්ලාට ගිහින් මෙහෙම කිව්වා.

"පින්වත.... මේවා ඔක්කොම මට දෙනවා නම් මං අස්පස් කරලා උයන පිරිසිදු කරලා දෙන්නම්" ඔහු ගෙන් ඊට අවසර ලැබුනා. එතකොට මොහු පොඩි දරුවන් සෙල්ලම් කරන තැනට ගියා.

"ළමයිනේ.... ඔයාල උක්පැණි බීලා... සීතල පැන් වළඳන්ට ආසයි ද....?"

"අනේ ඔව්... අපි හරි ආසයි."

"එහෙනම් මාත් එක්ක එන්න. ඉස්සෙල්ලාම මේ වැටිච්ච දරකෝටු ඔක්කොම එකතු කරගන්ට මට උදව් කරන්න.... ඊට පස්සේ මං ඔයාලට උක්පැණියි, සීතල වතුරයි දෙන්නම්."

ටික වෙලාවයි ගියේ. අර දර අතු සියල්ල උයන් දොරටුව අසල ගොඩ ගසා ගත්තා. එදා රජමැදුරේ කුඹල්කරුවාට රජපවුලට වළං හදන්ට දර මදි වෙලා සොය සොයා යනවා. උයන් දොරටුව අසල ඇති මේ දර දැකලා මේ තරුණයාගෙන් ඒ දර සියල්ල කහවණු දහසයකට මිලට ගත්තා. ඔහු එයින් උක් පැණි සමග වතුර දෙන්ට පහසුවට තවත් ලොකු භාජන පහක් මිලට ගත්තා. නගරයේ දොරටුව අසලින් එක් පැන් තලියක් තබා ගත්තා. තණමිටි ගෙන යන පන්සියයක් වෙළෙන්දන්ට උක් පැණිය වතුරයි දුන්නා. ඔවුන් හැමෝම මේ තරුණයා ගේ මිත්‍රයන් වුනා.

"මිත්‍රයා... ඔබේ උක් පැණියි වතුරයි නිසා අපේ වෙහෙස නිවුනා. අපෙන් මොනාද කෙරෙන්න ඕනා....!"

"අනේ මිතුරනි.... දැනට නම් මට අවශ්‍ය විශේෂ දෙයක් නෑ. මට ඕනකමක් වුනොත් කියන්නම්. එතකොට මට උදව් කරන්න." ඒ විදිහට මේ තරුණයා බිම් මාර්ගයේ වැඩ කරන අයයි, ජලමාර්ගයේ වැඩ කරන අයයි සමඟ හොඳ මිත්‍රත්වයක් ගොඩ නගා ගත්තා.

දවසක් බිම් මාර්ගයේ වැඩ කරන මොහුගේ යහළුවෙක් මොහුට හොඳ තොරතුරක් කිව්වා. අස් වෙළෙන්දෙක් අශ්වයන් පන්සියයක් අරගෙන එනවා කියලා. එතකොට මේ තරුණයා අර තණකොළ වෙළෙන්දන් ළඟට ගියා. "මිතුරනේ... මට අද ඔබෙන් උදව්වක් ඕනා. අද මට ඔබෙන් එක් තණ මිටිය බැගින් අවශ්‍යයි...... ඒ වගේ ම මගේ තණමිටි විකිනෙනකල් ඔයාල තණ විකුණන්න එපා හොඳේ...."

ඔවුන් දැඩි හිතවත්කම නිසා එයට කැමති වුනා. මොහුට තණ මිටිය බැගින් දුන්නා. අස් වෙළෙන්දා නගරය පුරා තණකොළ හොයනවා. එක තැනක විතරයි තියෙන්නේ. වෙන කොහේවත් නෑ. මොහුට කහවණු දහසක් ගෙවලා ඒ තණමිටි ගත්තා. ඊට දින කීපයකට පස්සේ ජලමාර්ගයේ වැඩ කරන කෙනෙක් මේ තරුණයාට තවත් තොරතුරක් කිව්වා. වරායට මහා නැවක් ආවා කියලා. එතකොට

මොහු කහවණු අටක් දීලා ඉතා අලංකාර රථයක් කුලියට ගත්තා. මහත් යස පිරිවර එක්ක වරායට ගියා. ඒ නැවියෙකුට ලස්සන මුද්දක් තෑගි දුන්නා. අලංකාර රෙදි වලින් ආවරණය වූ විශේෂ තැනක මොහු මහා වෙළෙන්දෙකුගේ ලීලාවෙන් වාඩි වෙලා හිටියා. බරණැස වෙළෙන්දන් බඩු ගැනීමේ අදහසින් එතැනට ආවා. එතකොට මොහු රඳවා සිටි මිනිසුන් ඒ වෙළෙන්ඳන් ළඟට ගොහින් මෙහෙම කිව්වා.

“මහත්තුරුනේ.... ඔබට අද බඩු ලැබෙන එකක් නෑ. මහා වෙළෙන්දෙක් ඇවිත් වේලාසනින් බඩු වලට අත්තිකාරම් ගෙවලා තියෙන්නේ” කියලා ඒ වෙළෙන්දන්ව තුන්වැනි දොරටුවෙන් කැඳවාගෙන මේ තරුණයා ළඟට ගෙන ගියා.

ඒ සියයක් පමණ වෙළෙන්දෝ එක් එක්කෙනා මොහුට කහවණු දාහ බැගින් දුන්නා. මොහු සමග මොහුගේ පිරිවර වශයෙන් නැවට ගියා. ආයෙමත් එක් එක්කෙනාට දහස බැගින් දීලා ඒ ඒ බඩු අරගෙන දුන්නා. මේ අතරමැදි වෙළඳාමෙන් මොහුට කහවණු දෙදහසක ආදායමක් ලැබුනා. මොහු ඒ මුදලින් භාගයක්, කහවණු දහසක් රැගෙන චූලසෙට්ඨිතුමා බැහැදකින්න ගියා. චූලසෙට්ඨිතුමා මෙහෙම ඇහැව්වා.

“ඇයි දරුවෝ.... මෙතරම් විශාල මුදලක් මට ගෙනාවේ.... මං ඔයාව කවුද කියලා හඳුනන්නේ නෑ නේ.”

“සිටුතුමනි, මීට හාරමාසයකට පෙර මං නිකං දිළිඳු කොලුවෙක්. එදා ඔබතුමා මහපාරේ තිබුන මී කුණක් දැකලා කිව්වා, හොඳට උපාය නුවණ ඇති කෙනෙකුට දියුණු වෙනවා නම් මේ මී කුණත් ඇති කියලා. මං ඒක අහගෙන හිටියා. මං ඔබතුමා ගේ වචනය විශ්වාස කළා. ඒ මී කුණ තමයි මගේ මේ දියුණුවේ පළමු පියවර.”

චූලසෙට්ඨිතුමා මේ තරුණයා ගැන ගොඩාක් සතුටු වුනා. ‘මේ වගේ දරුවෙක් වෙන කෙනෙකු සතු විය යුතු නෑ’ කියල හිතලා තමන් ගේ දියණියක් සමඟ කසාද බන්දලා දුන්නා. ඒ මහා සිටුපවුලේ සියලු වස්තුවත් මොහු සතු වුනා.”

මෙසේ වදාළ බුදුරජාණන් වහන්සේ මෙසේත් වදාළා.

"මහණෙනි, නුවණ තියෙන කෙනෙකුට හොඳ උපායශීලී බවකින් වැඩ කරන්ට පුළුවන් නම් ඉතා සුළු උපදේශයකින්, සුළු භාණ්ඩයකින් දියුණු වෙන්ට පුළුවනි. මහත් ධනයක්, යස පිරිවරක් උපදවා ගන්ට පුළුවනි. පුංචි ගිනි පුපුරකට වියළි ගොම, තණරොඩු ආදිය දමා කටින් පිඹිමින් එය මහා ගින්නක් බවට පත්කරන්නට පුළුවනි. ඒ වගේ තමයි උත්සාහයයි නුවණයි තියෙනවා නම් දියුණු වෙන්ට පුළුවනි.

ඉස්සර කාලෙ ඒ මී කුණ පෙන්නල මං කළ අවවාදය සිතට ගත්තු ඒ තරුණයා මහා ධනවතෙක් වුනා. ඒ මේ චූලපන්ථකයි. ඒ කාලෙ චූලසෙට්ඨි වෙලා සිටියේ මං නොවැ'යි මේ ජාතක කථාව නිමවා වදාළා.

පින්වතුනේ, පින්වත් දරුවනේ,

ගොඩාක් අය බාහිර අයගේ දියුණුව බල බලා හූල්ලමින් ඉන්නවා. පොඩි වෙළඳාමක්වත් කරන්න ලැජ්ජයි. මහා ඉහළින් පටන් ගන්ට සිතාගෙන ඉන්නවා. සිහින මාළිගා සිතින් හද හදා ඉන්නවා. අනුන්ට ඊර්ෂ්‍යා කර කර ඉන්නවා. නැකැත් නිමිති බල බල, දිසා බල බල ඉන්නවා. උත්සාහය නුවණ තියෙන කෙනා ඉතා සුළුවෙන් පටන් ගෙන දියුණු වෙලා යනවා. මේවා අපට හොඳ පාඩම්.



# සරණ සිහි කරමු

නමෝ බුද්ධාය!

දයාබර දුවේ පුතේ,

අලුත් බුද්ධ වර්ෂයක් ළඟ ළඟ ම එළඹෙනවා. අපමණ ගුණ ඇති සම්බුදුරජාණන් වහන්සේ ව ආදරයෙන් සරණ ගියපු අපි එක් බුද්ධ වර්ෂයක් පුරා ම පින් රැස් කර ගත්තා. මේ එළඹෙන බුද්ධ වර්ෂයේදීත් අපට ගුණයෙන් වැඩෙමින්, සීලයෙන් වැඩෙමින්, නුවණින් වැඩෙමින් බොහෝ පින් රැස් කරන්නට ලැබෙනවා නම් නේ ද හොඳ? ඔබ සියලු දෙනාටමත් එළඹෙන ශ්‍රී බුද්ධ වර්ෂ 2563 පිනෙන් වැඩී යන සුපින්බර අලුත් අවුරුද්දක් වේවා!!!

මේ සටහන ආරම්භයේ දී ම අපි ඔබට සිහිපත් කළා අපි සම්බුදුරජාණන් වහන්සේ ව ආදරයෙන් සරණ ගිය බව. දුවේ පුතේ, අපි ඒ උතුම් ශාස්තෘන් වහන්සේ පමණක් නොවෙයි; උන්වහන්සේ වදාළ උතුම් ධර්ම රත්නයත්, ඒ ධර්මය පුරුදු පුහුණු කරන තුන්කාලික ශ්‍රාවක සංඝ රත්නයත් ආදරයෙන් සරණ ගියා. එසේ සරණ යාමෙන් තමයි අපි සම්බුදු සසුනේ ශ්‍රාවකයන් බවට පත් වුණේ. ඒ උතුම් සරණාගමනය සිදු වුණේ 'බුද්ධං සරණං ගච්ඡාමි!, ධම්මං සරණං ගච්ඡාමි!, සංඝං සරණං ගච්ඡාමි!' යනුවෙන් පළමුවත්, දෙවනුවත්, තෙවනුවත් බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නය සරණ යන බව වචනයෙන් පැවසීමෙනුයි. දුව පුතා දිනපතා ම මේ ආකාරයෙන් තෙරුවන් සරණ යනවා නේ ද?

දුවේ පුතේ, 'සරණ' කියා කියන්නේ පිහිට, ආරක්ෂාව, රැකවරණය යන අදහසිනුයි. යම් කෙනෙකු අපට ආරක්ෂාව සලසනවා නම් ඒ කෙනාට අප කියන්නේ සරණ සලසන තැනැත්තා කියලයි. අපේ ජීවිතවල අම්මා තාත්තා සමීපයේ, සහෝදර සහෝදරියන් සමීපයේ, ගුරුවර වැඩිහිටි පිරිස් සමීපයේ යම් ආකාරයක ආරක්ෂාවක් තිබෙනවා. හැබැයි, 'අම්මා සමීපයේ අපිට ආරක්ෂාවක් තිබෙනවා' කියා සිහි කිරීමෙන් හැමවිට ම අපි ව රැකෙන්නේ නැහැ. එහෙත් යම් විටක ද අපි බුදුරජාණන් වහන්සේගේ සරණ සිහි කරන්නේ ඒ සෑම විටක දී ම අපට විස්මිත ආරක්ෂාවක් සැලසෙනවා.

අප මේ කියන්න යන කථා ප්‍රවෘත්ති කිහිපය දුව පුතා පෙරත් අසා තිබෙනවා. මේ දේවලින් සම්බුදුරජාණන් වහන්සේගේ සරණ කොතරම් විස්මිත ද යන්න ඔබට යම් පමණකින් හෝ තේරුම් ගන්නට පුළුවන් වේවි.

එක්තරා තරුණ දරුවෙක් දිසාපාමොක් නිවසේ මැනැවින් ශිල්ප ඉගෙන ගත්තා. සියලු ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ කළ ඔහු තමන්ගේ නිවස බලා පිටත් වුණේ ගුරු පඬුරු ගෙනවිත් ඇදුරුතුමාට බාර දෙන්නටයි. ඔහු නිවසින් කහවණු රැගෙන යළිත් දිසාපාමොක් නිවස බලා එන්නට පිටත් වුණා. ඔහුගේ නම ඡත්ත.

එදා මහා කාරුණික සම්බුදුරජාණන් වහන්සේ සමාපත්ති සුවයෙන් වැඩ හිඳිමින් අද පිහිට වන්නේ කාටදැයි යන අනුකම්පා සිතින් ලෝකය දෙස බලා වදාළා. කහවණු රැගෙන ගුරු නිවසට යන මේ ඡත්ත මානවකයා අද දවසේ සොරුන්ගේ පහර කෑමෙන් මිය යනවා. මෙසේ මිය ගියහොත් ඔහු උපදින්නේ නිරයේ. නමුත් ඔහුට තිසරණ සරණ පිටන්නට වාසනාව තිබෙනවා... සම්බුදුරජාණන් වහන්සේ ඔහු පැමිණෙන ගමන් මගේ ඉදිරි තැනෙක රුක් සෙවණක වැඩ සිටියා.

සම්බුදුරජුන්ගේ අසහාය රූපකාය දුටු පමණින් ඡත්තගේ සිත පැහැදුනා. ඔහු වන්දනා කළා. සතුටු සාමීචි කථා බහේ යෙදුණා. ඒ මොහොතේ සම්බුදුරජාණන් වහන්සේ ඔහුට තෙරුවන් ගුණ කියැවෙන ගාථා තුනක් කියා දී තෙරුවන් සරණේ පිහිටෙව්වා. සීලයේ ද සමාදන් කරවූවා. උන්වහන්සේට වැඳ එතැනින් නික්මුණ ඡත්ත මානවක ඉදිරියට ගියේ ඉතා අරුත්බර වූ ඒ උතුම් ගාථා රත්නයන් අරුත් මෙනෙහි කරමින් සජ්ඣායනා කරමිනුයි. සෑම දවසක ම අප පාසලේ සජ්ඣායනා කරනු ලබන ඡත්ත මානවක ගාථා තමයි ඒ ගාථා ත්‍රිත්වය. බලන්න, මේ උතුම් ගාථා රත්නයන් තුන තුළ තෙරුවන් ගුණ සිහි කරලමින් සරණ පිහිටන අපූරුව.

**"යෝ වදතං පවරෝ මනුජේසු**
**ශක්‍යමුනී භගවා කතකිච්චෝ**
**පාරගතෝ බල විරිය සමංගී**
**තං සුගතං සරණත්ථමු පේමි"**

"කථා කරන මිනිසුන්ට උතුම් වූ
ශාක්‍යමුනී භගවත් මුනිඳුන් වූ
බුදු කිස නිම කළ බල වෙර පළ කළ
සසරින් එතෙරට වැඩි නිදුකාණන්
සුගත තථාගත බුදු සමිඳාණන්
සාදරයෙන් මම සරණ යමී."

**"රාග විරාග මනේජ මසෝකං**
**ධම්මමසංඛත මප්පටිකූලං**
**මධුරම්මං පගුණං සුවිභත්තං**
**ධම්මම්මං සරණත්ථමු පේමි"**

"රාග කිසිත් නැති සෝක කෙලෙස් නැති
පිළිකුල් බව නැති අසංඛතයි සදහම්
මැනැවින් පවසන හොඳින් ප්‍රගුණ වන
මිහිරි උතුම් සදහම්
සාදරයෙන් මම සරණ යමී"

**"යත්ථ ච දින්න මහප්ඵලමාහු**
**චතුසු සුචීසු පුරිසයුගේසු**
**අට්ඨ ච පුග්ගල ධම්මදසාතේ**
**සංඝම්මං සරණත්ථමු පේමි"**

"යමෙකුට පිදුවොත් මහ ඵල ලැබ දෙන
සදහම් තුළ සිටි බුදු සවි සැම දෙන
උතුම් පුරුෂයන් යුගළ සතර දෙන
පුද්ගලයන් ලෙස වෙත් ම ය අට දෙන
ඒ උත්තම ශ්‍රාවක සඟ රුවන ද
සාදරයෙන් මම සරණ යමී"

මේ ආකාරයෙන් සරණ සිහි කරමින් ගමනේ යෙදුණු ඡත්ත මානවක සුළු මොහොතක දී දරුණු සොරුන්ගේ පහර දීමකින් මරණයට පත් වුණා. නිදා පිබිදියාක් වගේ දෙව්ලොව උපන්නා. ඡත්තමානවක විමාන වත්ථුවේ මේ පුවත විස්තර වෙනවා. නිරයේ යන්නට නියමිත ව සිටියෙක් දෙව්ලොව උපදවන්නට සමත් වුණේ සම්බුදුරජාණන් වහන්සේ ව සරණ ගිය බව, ධර්ම රත්නය හා සංඝ රත්නය සරණ ගිය බව සිහි කිරීම යි...

අසුරයන් හා දෙවියන් අතර කලහ පැනනගින අවස්ථා තිබෙන බව අප ධර්මය තුළ අසා තිබෙනවා. එක්තරා දවසක රාහු නම් අසුරයා හිරු මඬලට අධිගෘහිත වූ සූර්ය දිව්‍ය පුත්‍රයා ව අල්වා ගත්තා. අසුරයාගේ සූදානම සූර්ය දෙව්පුතු ව ගිල දමන්නටයි. එවිට සූර්ය දෙව්පුතු මෙසේ ගාථාවක් කියමින් සරණ සිහි කළා.

**"නමෝ තේ බුද්ධ වීරත්ථු**
**විප්පමුත්තෝසි සබ්බධී**
**සම්බාධපටිපන්නෝස්මි**
**තස්ස මේ සරණං භවාති"**

"නමස්කාර වේවා සම්බුදු වීරයාණෙනි
ලොවේ ඇති හැම දුක්වලින් මැනැවින් මිදුන මුනිඳුනි
මම වනාහී දැන් අනතුරට පත් වූවෙමි
මෙසේ වූ මා හට පිහිට සලසන සේක්වා!"

අසුරයන්ගේ බලවත් බව ඉදිරියේ දෙදෙව්ලොවට අධිපති සක් දෙවිඳු පවා පසුබසින අවස්ථා තිබෙනවා. තමන්ගේ නායකයා වූ සක් දෙවිඳු සිහි නොකොට මේ මොහොතේ සූර්ය දිව්‍යපුත්‍රයා විසින් සිහි කරන්නේ සම්බුදුරජාණන් වහන්සේ ව යි. ඒ වේලාවේ සම්බුදුරජාණන් වහන්සේ සූර්ය දිව්‍යපුත්‍රයා සම්බන්ධයෙන් ගාථාවක් වදාරමින් ඔහු ව අතහරින ලෙස රාහු අසුරයාට පැනවීමක් කළා. බුද්ධ ආඥාවට කීකරු නොවීමේ කරුණෙන් හිස සත්කඩකට පැළී යන්නට පළමු රාහු අසුරයා වහා ම සූර්ය දිව්‍යපුත්‍රයා ව අතහරිනු ලැබුවා. සූර්ය දිව්‍යපුත්‍රයා සුවපත් භාවයට පත් වූවා. සූර්ය පිරිත නමින් අප සජ්ඣායනා කරන්නේ මේ සිදුවීම සත්‍යයක් බව යි.

මේ ආකාරයෙන් ම තවත් අවස්ථාවක රාහු අසුරයා විසින් සඳ මඬලට අධිගෘහිත චන්දිම දිව්‍යපුත්‍රයා ව ද අල්වා ගත්තා. ඒ මොහොතේ චන්දිම දිව්‍යපුත්‍රයා සිදු කළේ ද ඉහත ගාථාව ම පවසමින් සම්බුදුරජාණන් වහන්සේ ව සිහි කිරීම යි. ඒ අවස්ථාවේ දී ද සම්බුදුරජාණන් වහන්සේ චන්දිම දිව්‍යපුත්‍රයා සම්බන්ධයෙන් ගාථාවක් පවසමින් රාහු අසුරයාට අවවාද කරනු ලැබුවා. සම්බුදුරජුන්ගේ ආඥාවට කීකරු නොවීම තමා ව මහත් වූ විපතකට හෙළන බව දැන සිටි රාහු අසුරයා වහා ම චන්දිම දිව්‍යපුත්‍රයා ව ද අතහරිනු ලැබුවා. චන්දිම දිව්‍යපුත්‍රයා සුවපත් භාවයට පත් වුණා.

තවත් අවස්ථාවක සැවැත්නුවර ජේතවනාරාමයේ දී සම්බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා අමතා මෙසේ වදාළා.

“පින්වත් මහණෙනි, පෙර සිදු වූවක් පවසන්නෙමි. බොහෝ කලකට පෙර දේවාසුර සංග්‍රාමයක් වූයේ ය.”

මේ කරුණ දක්වමින් සම්බුදුරජාණන් වහන්සේ වදාළේ සංග්‍රාම භූමියට යන්නා වූ දෙවිවරුනට බියක් හෝ තැතිගැනීමක් හෝ ලොමුදැහැ ගැනීමක් ඇති වූයේ නම් සක් දෙවිඳුන්ගේ ධජයේ මුදුන බලන්නට යැයි සක් දෙවිඳුන් අවවාද කරන බවයි. නොඑසේ නම් පජාපතී දෙවිඳුගේ හෝ වරුණ දෙවිඳුගේ හෝ ඊශාන දෙවිඳුගේ හෝ කොඩිවල මුදුන් බලන්නට යැයි ද එවිට බිය, තැතිගැනීම්, ලොමුදැහැ ගැනීම් පහ වී යන්නේ යැයි ද සක් දෙවිඳු පවසා සිටිනවා. නමුත්, එපමණකින් දෙවිවරුනගේ බිය, සන්ත්‍රාස පහ වී නොයන්නට ද ඉඩ ඇති බව සම්බුදුරජාණන් වහන්සේ වදාළා. මොකද සක් දෙවිඳුන් ද රාග, ද්වේෂ, මෝහ සහිත වූවෙක්, එහෙයින් ම බියට පත් වනවා, තැතිගන්නවා, පලා යනවා. බලන්න, අප රැකවරණය කියා සිතන අම්මා තාත්තා, ගුරුවර වැඩිහිටියන් සම්බන්ධයෙන් ද මේ කරුණ මෙහෙම ම යි නේ ද? එනිසා යම් යම් අවස්ථාවල ඔවුන් සිහි කිරීමෙන් අපට රැකවරණය නොලැබෙන්නටත් පුළුවනි...

මේ උතුම් දේශනාවේ දී සම්බුදුරජාණන් වහන්සේ තවදුරටත් භික්ෂූන් වහන්සේලාට මෙසේ අවවාද කරනවා.

''පින්වත් මහණෙනි, ඔබ ද ආරණ්‍යයකට වේවා, රුක් මුලකට වේවා, පාළු තැනකට වේවා ගිය කල්හි බියක් හෝ තැතිගැනීමක් හෝ ලොමුදැහැ ගැනීමක් ඇති වුවහොත් එවිට මා සිහි කරන්න. **"ඉතිපි සෝ භගවා අරහං...."** එවිට බිය තැතිගැනීම් ලොමුදැහැ ගැනීම් පහව යන බව සම්බුදුරජාණන් වහන්සේ වදාරණවා. එසේ සම්බුදුරජාණන් වහන්සේ ව සිහි නොකරන්නේ නම් **"ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ..."** වශයෙන් උතුම් ධර්ම රත්නය ද නොඑසේ නම් **"සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ"** වශයෙන් උතුම් සංඝ රත්නය ද සිහි කරන ලෙසත් එකල්හී ද බිය තැතිගැනීම් ලොමුදැහැ ගැනීම් පහව යන බවත් සම්බුදුරජාණන් වහන්සේ වදාරණවා. එයට හේතුව මෙය යි. **"තථාගතයන් වහන්සේ නිකෙලෙස්. සම්මා සම්බුද්ධ යි. වීතරාගි යි. වීතදෝෂි යි. වීතමෝහි යි. බිය වන්නේ නැහැ. තැති ගන්නේ නැහැ. පලා යන්නේ නැහැ."** දුවේ පුතේ, සැබැවින් ම ඒ උතුම් සරණ විස්මිතයි නේ ද!

මෝර ජාතකයේ පුවත ද මේ ආකාරයෙන් ම විශාල ආරක්ෂාවක් සලසාලූ සරණ සිහි කිරීමක් ගැන කියැවෙන්නක්. ඒ බෝසත් මොනරා වසර හත්සියයක් පුරා හිමාලයේ පර්වතවල වෙසෙමින් කිසිදු උගුලකට හසු නොවූයේ, කිසිදු උපද්‍රවයකට පත් නොවූයේ, මගතොටේ අනතුරකට ලක් නොවූයේ සෑම දිනක ම දහම් පරතෙර වැඩි උතුමන්ටත්, උතුම් මඟ ඵල නුවණටත් වන්දනා කිරීමෙන්.

**"යේ බ්‍රාහ්මණා වේදගූ සබ්බධම්මේ**
**තේ මේ නමෝ තේ ච මං පාලයන්තු**
**නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා**
**නමෝ විමුත්තානං නමෝ විමුත්තියා"**

"හැම දහම් පරතෙර වැඩි
යම් රහත් මුනිවරු සිටිත් නම්
ඒ උතුම් මුනිවරු හට මාගේ වැඳුම වේවා
ඒ උතුම් මුනිවරු ද මගේ දිවි සුරකිත්වා
සම්බුදුවරුන් හට මාගේ වැඳුම වේවා
සතර මග ඵල නුවණට මාගේ වැඳුම වේවා
උතුම් රහතුන් හට මාගේ වැඳුම වේවා
ඒ රහත් ඵලයට මාගේ වැඳුම වේවා"

ගමනක් බිමනක් යන විට මේ උතුම් අර්ථ සිහි කරමින් අපට ද ඝෝර පිරිත සජ්ඣායනා කරන්නට හැකි නම් එය අපට මගතොටේ අනතුරු අවම කොට ආරක්ෂාව සලසාලන්නට උපකාරක වනවා. දුවේ, පුතේ, මේ එදිනෙදා ජීවිතය තුළ දී ද අපට පිහිට පිළිසරණ පිණිස පවතින සිහිපත් කිරීමක්. මේ ජීවිතයට විතරක් නෙවෙයි, පරලොව ද පිහිට පිළිසරණ පිණිස පවතින සිහිපත් කිරීමක්.

ඔබත් මේ උතුම් ගාථා රත්නයන් හොඳින් පාඩම් කර ගන්න. අර්ථය ද මැනැවින් පාඩම් කර ගන්න. එදිනෙදා කටයුතු අතරේ මේ උතුම් ගාථා රත්නයන් සජ්ඣායනා කිරීම පුරුද්දක් කර ගන්න. බලන්න, සිහි කළ පමණින් අපමණ සෙත සැලසෙන අසිරිමත් වූ විස්මිත වූ ශාස්තෘන් වහන්සේනමක් නේ ද අපට සරණ යන්න ලැබුණේ. මේ එළඹෙන බුද්ධ වර්ෂය තුළ ඔබත් ගුණයෙන්, නුවණින්, සීලයෙන් වැඩෙමින් ඒ පරම උත්තම ශාස්තෘන් වහන්සේට තවත් සමීප වෙන්න. ශාස්තෘන් වහන්සේගේ අවවාදය අනුව ම කටයුතු කරමින් සියලු රැකවරණ සලසා ගන්නා උතුම් බුද්ධ ශ්‍රාවකයෙක් වෙන්න. ඔබට ඒ උදෙසා උතුම් තෙරුවනේ අනන්ත ගුණානුභාවයෙන් පිහිට, පිළිසරණ සැලසේවා!

තෙරුවන් සරණයි!

# නිර්මාණ ඉසව්ව


පැදියෙන් සිතුවමින් නිසඳැසින්
සුසැදි ඔබේ නිර්මාණ එකතුව



පවනි හෂින්තා දියණිය විසින් එවූ නිර්මාණයක්...




තක්ෂිලා සඳුනි රූපසිංහ දියණිය විසින් එවූ නිර්මාණයක්...



නෙත්මි ශෂිකලා දියණිය විසින් එවූ නිර්මාණයක්...



කාවින්ද්‍යා චමෝදි ජයතිස්ස දියණිය විසින් එවූ නිර්මාණයක්...




අමාෂා නෙත්මිණී දියණිය විසින් එවූ නිර්මාණයක්...



ලක්ප්‍රිය සඳරුවන් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...




සංජන ප්‍රියනාත් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



සුලාරි මධුවන්ති දියණිය විසින් චවූ නිර්මාණයක්...




පුබුදු දිල්ෂාන් ජයරත්න පුතණුවන් විසින් චවූ නිර්මාණයක්...




ප්‍රශාන් ලක්ෂාන් කුමාර පුතණුවන් විසින් චවූ නිර්මාණයක්...



ගිහාන් සංජය පුතණුවන් විසින් චිවූ නිර්මාණයක්...




නෙත්මි කවිශ්‍යා දියණිය විසින් චිවූ නිර්මාණයක්...



ලක්මිණී ශ්‍රීමාලි දියණිය විසින් චිවූ නිර්මාණයක්...

හද පතුලේ
සෙනෙහසින්
මා වැඩූ
මෑණියනි...,
පියාණෙනි...,
සිප් තෙරෙන්
මා පෙවූ
මාගේ ගුරු මෑණියනි...,
පියාණෙනි...,
නෙතින් දැක
සැනසෙන්න...
තවද පින් මදි වුවද
මාගේ කැපකරු
මව්නි...,
පියාණෙනි...,
මෙතෙක් ආ
දිවි මගේ
නෙත් නුවන් පාදවා
එළිය කළ
මෑණියනි...,
පියාණෙනි...,
**උතුම් දළදා සමිඳු සරණයි!**

උත්පලා දියණිය විසින් එවූ
නිර්මාණයක්...

ඉරිතලා ගිය පොළවට
උතුම් ජලබිඳ ඔබය,
කටුක හිරු රශ්මි නිවූ
සිහිලැල් මද පවන,
වියලුණු දිවි මගට
ඔබ ගෙනා ඒ අරුත
දයා පිරි හද පතුල්
නගයි සැමදා මෙලෙස

නෙතු අතර ගලා ගිය
කඳුලු කැට පිස දැමූ
සොඳුරු පින්බර දෑත
ඔබ සතුයි, ඔබ සතුයි,
සෙනේ ගඟ ගලා විත්
නැවතුනිද මා අසල
පිරී ඉතිරී යන්නෙ
දයාවෙනි නිතර හද
පුදමි පින් මෙලෙසින්
දයාබර දියණී ඔබ.

මනීෂා ලවන්‍යා දියණිය විසින්
එවූ නිර්මාණයක්...

## කැපකරු සියලු දෙමාපියන් වෙත...,

දස මස කුස දරා ඔබ මා නො වැදුව ද
ලේ කිරි කර පොවා මා ඇති දැඩි නො කෙරුව ද
ඔබෙ පණ කියා මා රක්ෂා නො කෙරුව ද
සෙවනැල්ලක් වීය නිබද මාගේ ඉගෙනුමට

මතු යම් දිනක මා සිප් සතර ලැබ
මනුදම් පිරි උගතෙක වී නිබඳ
කොතැනක සිටියත් ඔබ මේ අහස යට
ගන්නෙමි ආශිර්වාද මා ඔබෙ පා නැමද

නමදින විටදි ඔබගේ දෙපා වැඳ
සතුටින් ඉපිල බැතිබර ඔබෙ කුළුණු හද
ගලනා කඳුලු ඔබගේ දෑසින් නිබඳ
පිසලමි කඳුලු මාගේ දෑතින් එවිට

මා රැස් කළ පින් ඔබට පුදන්නම්
මතු බවයේ ඔබ බුදු වේවා!
මාගේ ආයුෂ ඔබට පුදන්නම්
සැමදා සුවසේ ජීවත් වේවා!

නොදැකපු දෙවියන් වැන්දද සැමදා
ඔබමයි මාගේ මනුලොව දෙවියන්
සසරේ භව දුක ඔබෙ නැති වේවා!
නිවන් සුවෙන් ඔබ නිති සැනසේවා!!!

ඒ.එම්. සෂිනි අමා කරුණාරත්න දියණිය විසින්
එවූ නිර්මාණයක්....

## මිනිසත් බවින් ලොව දකිනා ඔබ හට...

කඳු මුදුනට හිරු පායා
දිලෙයි අහස් ගැබේ...
අත්තටු විහිදා එළියට උන්
කුරුලු ගීත ගයයි උදේ...
සිතුවිලි අඩවන් කර
මා පවසයි ඔබට මෙසේ...
දිරිය දරා සිතට ගන්න
පුංචි මල් කැකුළියේ...

ගොහොරු මඩෙහි උපත ලබා
ගොහොරු මඩෙන් එළියට විත්
දසත පැතිරූ සුවඳ දුන්
නෙළුම වෙයන් සොයුරියේ...

පුංචි මල් කැකුළු
පරවේවි හරි ඉක්මණින්...
මෙලෙහි රොන් ගන්නට
බඹරු පිරේ දසත දෙසින්...
විගස රොන් ගත් මල
විගස ගිලිහී යයි ගසින්...

මහ වැසි වසීවි...
සැඩ සුළං හමාවි
එපා අතහරින්නට
නුඹ ගසින් ගිලිහේවි....

අටලෝ දහම එනවිට
නොසෙල් වේ නම් ඔබෙ සිත
නොතෙමේවි නුඹ
ගිලිහි නොයාවී...
සොයුරියේ නුඹ දිනාවී...

නිපුනි සයංජලී දියණිය විසින්
එවූ නිර්මාණයක්....

ආදරණීය අම්මේ...
තාත්තේ...
පිනට දහමට ලැදි
සොඳුරු ගුණ නුවණැති
ඔබ වැනි අයම නිති
ලොවට සැමදා වැඩැති

නොදුටුවද මා නුඹව
දැනෙයි ඔබෙ ගුණ සුවඳ
ඉගෙනුම් මගෙහි තෙර
කරා පිය මැනුමට
ශක්තියක් වී නිතින
කරන මේ උපකාරයට
බසෙහි වදනක් මදිය
ඔබෙ ගුණ ගයන්නට

ඔබ වැනිම මිණිරුවන්
වී අනාගත ලොවට
සැපයුමයි සේවයක්
පරම පිවිතුරු පැතුම

එයට සැමදා නිතින දිරිදෙන
දයාබර මව්පියනි කැපකරු
යෙහෙන් වැජඹී දිවි මඩල තුළ
ලබත්වා ඔබ සැම දිගාසිරි

තෙරුවන් සරණයි!

දසුනි කාවින්ද්‍යා දියණිය විසින්
එවූ නිර්මාණයක්....

## මාගේ දයාබර අම්මේ ඔබයි!

රළ නගන මහ සයුරෙ රුවල් නැව ඔබයි
ගිනියම් වැලි කතරෙ ක්ෂේම භූමිය ඔබයි
නොනිමි දැල්වෙන පහන් ආලෝකය ඔබයි
කිසිදා මා අත්නොහරින මගේ ආදරය ඔබයි

මාගේ ආදර අම්මේ...

සැලෙන මල් ගොමු අතරෙ විහිදෙන සුවඳ ඔබයි
සැඳෑ අහසේ පායන සඳ කිරණ ඔබයි
ජීවිතයේ අරුත මට කියාදුන්නේ ඔබයි
මාගේ ජීවන ගමනෙ නවාතැන්පල ඔබයි

මාගේ දයාබර අම්මේ...

ළා රැස් විහිදන හිරු කුමරි ඔබයි
දෙරණ භූමියට පෑයූ ජල උල්පත ඔබයි
මාගේ ජීවිතයේ පහන් ටැඹ ඔබයි
සදා නොමැකෙන ආදර නාමය ඔබයි

මාගේ ආදර අම්මේ...

එක ඉත්තක පිපුණු මල් යුවලක් සේමා
පෙම්බර ඔබ කුස තුළ යළි මා ඉපදේවා
ගැහෙන හැම මොහොතකම ඔබ මා සිහිවේවා
මාගේ හැම ආත්මයකම ඔබ මව් වේවා!

මාගේ දයාබර අම්මේ...

එම්.එල්.ඒ. නිලංජි හර්ෂිකා දියණිය විසින්
එවූ නිර්මාණයක්....

## අනිත්‍ය සත්‍ය

නින්දක් නැතිව සිහිනය ඇතිවිය    නො හැක
මනසක් නැතිව සිතුවිලි ඇතිවිය    නො හැක
දුකකින් තොරව සැපකුත් ඇතිවිය    නො හැක
නිවනෙන් මෙපිට සතුටක් දැකිය ද    නො හැක

හට ගැනීමක් සමඟ නැතිවීමක්    ඇත්නම්
ඉපදීමක් සමඟ මරණය සත්‍යක්    නම්
සතුටක් සමඟ දුකකට ඉඩකඩ    ඇත්නම්
ජීවිතයක් කියා දෙයකට ඇයි ලෝබ    කම්

දින සති මාස අවුරුදු ගෙවිලා    යාවි
ලස්සන හම සිරුර නිය දිරලා    යාවි
දිගු කෙස් කලඹ අවමඟුලට    සැරසේවි
මටත් හොරෙන් මගේ ඇසුත් පිය    වේවි

මග දැන දැනත් යන්නට නම් පිනක්    නැති
පව්වල බරෙන් ගිහි දිවියක හිරව    ඇති
කෙතරම් පින් කළත් සැපතක් පතන්    නැති
ලොව්තුරු දහම අවබෝධෙට පැතුම්    ඇති

සසරේ තවත් දුර යන්නට සිතක්    නැති
උන් හිටි තැනම ඉඳ ඒ ගැන සිතා    ඉම්
මරණින් කෙළවරක් නැති බව නම්    හැඟුණි
දුක උරුමය කරන් කිම ඉපදෙනු    සිතම්

ආසයි මිදෙන්නට සියලුම සසර    බවින්
ආසයි නිවෙන්නට ලොව්තුරු අමා    දමෙන්
ආසයි පිටව යන්නට ගිහි දොර    අගුලෙන්
ආසයි විඳින්නට සිවුරේ කහ    පහසින්

ජී.ජී. හිරුණි ප්‍රබෝදනී රූපසිංහ දියණිය විසින්
එවූ නිර්මාණයක්....

## ගුණ ගායනා

සසර ගමන විඩා නිසා
එයි සැවොම හති වැටිලා
අඳුරු පටල අතැර දමා
එළිය වෙතට සිත දුවලා

බෝ මැඩ සිලි සිලිය නැගේ
සම්බුදු බණේ අගය දැනේ
කැපකරු මෑණියනි ඔබ මිසක් ලොවේ
මා හට සරණ වුණේ වෙන කවුද අනේ

රිදුමක් තිබුණත් හදවතේ නොකියූ
කඳුලක් තිබුණයි ඒ මත රැඳුණු
ඉපදුණ දා පටන් වින්දලු දුක් මෙලොවේ
හිත සදන්න සහය වුණේ ඔබ පමණයි පියාණනි

සසර ගමන කෙළවර නැත
මසුරු කමයි - වෛර නිසයි
නැත මේ ගති ඔබේ ළඟ
දෙමාපියනි, එනිසා සිත් සුවෙන් ඇත.

ජිත්මිණී උදාරා දියණියය විසින්
එවූ නිර්මාණයක්....

---

මගක් පෙන්වූවා දෑත දිගු කර,
අධ්‍යාපනය නම් එල නෙලීමට,
මෑණියනි, පියාණනි
හැකි වේවි නො අනුමානයි
මිහිරි එල නෙළා ගැනීමට
මා හට....

කේ.ජ්. පසිඳු මල්ෂාන් පුතණුවන් විසින්
එවූ නිර්මාණයක්....

කඩයිම් රැසක් පසු කොට
යන්න සරසවි පුද බිමට මට
දිරිය දුනි නිතැතින්ම
තුති පුදමි....
දෑත් එක්කොට
නුඹගේම පුතෙකු මෙන්
නැණ පහන් දල්වන්නට
රැකුල් වූ ඔබ සැමට....

දස මසක් කුස හොවා
මා ලොවට බිහි කළ
උත්තරීතර මව් පදවිය
ලැබූ ඔබේ නමට මම
ණය ගැතියි මෑණියනි....

සිව් හසක් සිසු කැලට
ලබන්නට නැණ නුවණ
මග පෙන් වූ නුඹ
මගේ දිවි මං එළිය
ලැබ දුන්නු ඔබෙ නමට
ණය ගැතියි විදු මව්නි....

නෙත් නුවන් පාදවා
දිවි ගමන එළිය කළ
මාගේ කැපකරු මව් පියාණෙනි,
පුදමි මම මල් මිටක්
මහද පිරි සෙනෙහසින්
මා විසින් ඔබ නමට....

මා ගෙවන දිවි ගමන
කෙටි කරගන්නට මේ මට
කියාදෙන හාමුදුරුවෙනි,
වඳිමි මම සැදැහැතින්
ඔබෙ පා යුගල ළඟ
දණ නමා බැති සිතින්....

ඊ.ජී. පේක්ෂණ පුතණුවන් විසින්
එවූ නිර්මාණයක්....

**කැපකරු මාපිනි...**

බිය දැක සසර
මෙදියතෙන් වන්නට එතෙර
මහ සටනකි මරු පරදන
අසුභය දකින්න
නොඇලෙන්න
නොගැටෙන්න
ඇති සැටියෙන් දකින්න
ප්‍රඥාව වඩන්න
ඔබ....
ගෙවෙන හැම තත්පරයක ම
නිදුකාණන් අසල බව සිතන්න

හලා හලා විෂ වපුළ
රුපු වන සතුන් ගහන
එකිනෙකා පරයමින් නැගෙන්නට
වෙර දරන නොමිනිසුන් අතර
කසාවත නොමැතිවද
මෙත් පුරන උවැසියට
නිවනට දොරටු දක්වන
සෙත සදන මහා වෘක්ෂය
ඔබය....

දෙවෙනි මව්වරු පියවරු ලෙස
ගුණමකු නොමිනිසුන් අතර
හෙට ලොව දිනන්නට වෙර දරන
පුංචි මල් කැකුළකට
අත්වැලක් වූ ඔබ....

සැබැවටම පෙර සසරක
මගේම මා, පිය වන්නට ඇත

සැමදාමත් ණයගැති වෙමි
දයාබර කැපකරු මව්වරුනි,
පියවරුනි
ඔබ හට....

කල්පනා මුතුමාලි දියණිය විසින්
එවූ නිර්මාණයක්....

## මෝර පිරිත

**උදේත’යං චක්ඛුමා ඒකරාජා**
**හරිස්සවණ්ණෝ පඨවිප්පභාසෝ**
**තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං**
**තයජ්ජ ගුත්තා විහරේමු දිවසං**

මේ හිරු උදා වන විට - ඇස් ඇති එක ම රජු ලෙස
පතුරුවා රන්වන් රැස - මහ පොළොව බබුළුවන්නේ
මහ පොළොව බබුළුවන - හිරු මඬල නුඹ වඳින්නෙමි මම
නුඹ විසින් සුරකින අපි - මෙ දවස වසමු සුවසේ

**යේ බ්‍රාහ්මණා වේදගූ සබ්බධම්මේ**
**තේ මේ නමෝ තේ ච මං පාලයන්තු**
**නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා**
**නමෝ විමුත්තානං නමෝ විමුත්තියා**

හැම දහම් පරතෙර වැඩි - යම් රහත් මුනිවරු සිටිත් නම්
ඒ උතුම් මුනිවරු හට - මාගේ වැඳුම වේවා
ඒ උතුම් මුනිවරු ද - මගේ දිවි සුරකිත්වා
සම්බුදු වරුන් හට - මාගේ වැඳුම වේවා
සතර මඟ ඵල නුවණට - මාගේ වැඳුම වේවා
උතුම් රහතුන් හට - මාගේ වැඳුම වේවා
ඒ රහත් ඵලයට - මාගේ වැඳුම වේවා

**ඉමං සෝ පරිත්තං කත්වා මෝරෝ චරති ඒසනා.**

ඒ බෝසත් මොණරා මේ ලෙසින් පිරිත පවසා ගොදුරු සොයන්නට සැරිසරා යන්නේ ය.

**අපේත’යං චක්ඛුමා ඒකරාජා**
**හරිස්සවණ්ණෝ පඨවිප්පභාසෝ**
**තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං**
**තයජ්ජ ගුත්තා විහරේමු රත්තිං**

පතුරුවා රන්වන් රැස - බබුළුවා මේ පොළොව ද
ඇස් ඇති එක ම රජු ලෙස - හිරු මඬල බැස යන විට
මහ පොළොව බබුළුවන - හිරු මඬල නුඹ වදින්නෙමි මම
නුඹ විසින් සුරකින අපි - මේ රැය ද වසමු සුව සේ

**යේ බ්‍රාහ්මණා වේදගූ සබ්බධම්මේ**
**තේ මේ නමෝ තේ ච මං පාලයන්තු**
**නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා**
**නමෝ විමුත්තානං නමෝ විමුත්තියා**

හැම දහම් පරතෙර වැඩි - යම් රහත් මුනිවරු සටිත් නම්
ඒ උතුම් මුනිවරු හට - මාගේ වැඳුම වේවා
ඒ උතුම් මුනිවරු ද - මගේ දිවි සුරකිත්වා
සම්බුදු වරුන් හට - මාගේ වැඳුම වේවා
සතර මඟ ඵල නුවණට - මාගේ වැඳුම වේවා
උතුම් රහතුන් හට - මාගේ වැඳුම වේවා
ඒ රහත් ඵලයට - මාගේ වැඳුම වේවා

**ඉමං සෝ පරිත්තං කත්වා මෝරෝ වාසමකප්පයීති.**

ඒ බෝසත් මොණරා මේ ලෙසින් පිරිත පවසා සුවසේ වාසය කළේමය.

**ඒතේන සච්චේන සුවත්ථි හෝතු!**

මේ සත්‍යානුභාවයෙන් සැමට සෙත් වේවා!